# 2023 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

# ජාතික පොලිස් කොමිෂන් සභාව

# වැය ශීර්ෂ අංකය 08

## අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ....................................................................................................02

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ....................................................................................................10

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ..............................................................................35

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක ....................................................................................................49

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ..........................50

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ ....................................................................................................52

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව ....................................................................................................53

# 01 පරිච්ඡේදය
# ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

2002 වර්ෂයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මෙරට තුළ පිහිටවනු ලැබූ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනත් කවර රාජ්‍ය ආයතනයකටත් වඩා බලතල හා කාර්යභාරය වරින්වර වෙනස් වෙමින් ක්‍රියාත්මක වූ ආයතනයකි. 2002 වසරේදී 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස්පතිවරයා හැර සියලුම පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීමේ බලතල සහ පොලිස් නිලධරයෙකුට හෝ පොලිස් සේවයට හෝ එරෙහිව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීමේ බලතල කොමිෂන් සභාව වෙත හිමිවිය. එසේ වුවද 2010 වසරේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 18 වන සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල පොලිස් නිලධරයන්ට එරෙහිව ඉදිරිපත් වන මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පමණක් සීමාවිය. නැවතත් 2015 වසරේ දී 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, මාරු කිරීම් හා විනය බලතල මෙන්ම මහජන පැමිණිලි විමර්ශන බලතල ද කොමිෂන් සභාව වෙත පැවරිණි. 2020 වසරේ දී 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සශෝධනය මගින් කොමිෂන් සභාවේ බලතල නැවතත් මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ බලතලවලට පමණක් සීමාවිය.

කෙසේ වෙතත් 2022 ඔක්තෝම්බර් මස 31 වන දින සම්මත කරන ලද 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් නැවතත් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පූර්ණ බලතල හිමිවිය. එහෙත් 2022.10.31 දින සිට 2023.05.15 දින දක්වා නව කොමිෂන් සභාව පත්කරන තුරු 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ එතෙක් ක්‍රියාත්මක වූ කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

2023 මැයි මස 16 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ගරු ජනාධිපතිතුමා විසින් විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඊ.ඩබ්.එම්. ලලිත් ඒකනායක මහතාගේ සභාපතිත්වයෙන් යුතුව නව කොමිෂන් සභාවක් පත් කරන ලදී. අධිකරණ ක්ෂේත්‍රය, නීති ක්ෂේත්‍රය, රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය, සමාජ විද්‍යා ක්ෂේත්‍රය සහ කළමනාකරණ ක්ෂේත්‍රය වැනි ක්ෂේත්‍ර ගණනාවක විශිෂ්ට එමෙන්ම අත්දැකීම් බහුල සාමාජිකයින්ගෙන් වර්තමාන ජාතික පොලිස් කොමිෂන් සභාව සමන්විත වේ.

2023 සමාලෝචිත වර්ෂයේ නව කොමිෂන් සභාව පත්වීමත් සමගම කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන නෛතික පසුබිම සැකසීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව අංක 2341/51 සහ 2023.07.20 දිනැති **"ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පැවරීම"** නම් අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරමින් ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් (පොලිස් ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ,

විනය පාලනය කිරීමේ හා සේවයෙන් පහකිරීමේ බලය පොලිස්පතිවරයා සහ අනෙකුත් ජොෂ්ඨ පොලිස් නිලධාරීන් වෙත අභිනියෝජනය කරන ලදී. එසේ අභිනියෝජනය කරන ලද බලතල සම්බන්ධයෙන් කරනු ලැබූ යම් නියෝගයක් හේතුකොට ගෙන අතෘප්තියට පත්වන යම් පොලිස් නිලධරයෙකුට එවැනි නියෝගයකට එරෙහිව ලිඛිත අභියාචනයක් පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත්කල හැකිවන පරිදි අංක 2345/45 සහ 2023.08.16 දිනැති **"අභියාචනා කාර්ය පටිපාටික රීති"** නම් අති විශේෂ ගැසට් නිවේදනය මගින් රීති සකස් කර ඇත.

එමෙන්ම අංක 2345/46 සහ 2023.08.16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරමින් **"මහජන පැමිණිලි භාරගැනීම සහ විමර්ශනය කිරීම සඳහා වන කාර්ය පටිපාටික රීති"** ඇතුලත් පොලිස් නිලධාරින් හෝ පොලිස් සේවයට එරෙහි මහජන පැමිණිලි විමර්ශන රීති සකස් කර ඇත. එමෙන්ම මේවන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ (3) (අ) වන ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සම්පාදනය කර ගැසට් පත්‍රයේ පල කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.

සමාලෝචිත වර්ෂයේ නව කොමිෂන් සභාව පත්වී මාස 07 ක් පමණ කාලයක් ක්‍රියාත්මක වී ඇති අතර එම කෙටිකාලය තුළ පොලිස් සේවාව ස්වාධීන, කාර්යක්ෂම සහ අපක්ෂපාතී සේවාවක් බවට පත් කිරීම සම්බන්ධයෙන් වැදගත් තීරණ ගණනාවක් ගෙන ඇත.

ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ දී එකී පැමිණිලි අතර බොහෝ පොලිස් ස්ථානාධිපතිවරුන් සහ පොලිස් නිලධරයන් වෙත චෝදනා එල්ල වී ඇත්තේ සාමය කඩවීම හා සාමය කඩවීමට අත්‍යාසන්න ආරවුල් සම්බන්ධයෙන් නිසි නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම බවට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත. ඒ අනුව එවැනි සාමය කඩවීමට අත්‍යාසන්න ආරවුල් (ඉඩම් ආරවුල්) පොලිස් ස්ථානාධිපති වෙත වාර්තා වීමෙන් අනතුරුව 1979 අංක 44 දරණ ප්‍රාථමික අධිකරණ නඩු විධාන සංග්‍රහ පනතේ "66 වගන්තිය" ප්‍රකාරව කටයුතු කිරීමට විමර්ශන නිලධාරින්ට නියම කිරීමේ වගකීම ඒ ඒ පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත පැවරෙන බවට දන්වා නියෝග නිකුත් කරන ලෙසට පොලිස්පතිවරයා වෙත දැන්වීම සහ ඒ සඳහා පසුවිපරම් ක්‍රමවේදයක් සකස් කිරීම, එවැනි එක් වැදගත් තීරණයක් වේ. ඒ අනුව මේ වනවිටත් පොලිස්පතිවරයා විසින් එම නියෝග අනුව ක්‍රියා කර ඇත.

තව ද පොලිස් සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කරන ප්‍රතිපත්තිමය තීරණවලට අමතරව කොමිෂන් සභාවේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳව සහ මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ වගකීම සම්බන්ධයෙන් දිවයින පුරා රාජකාරියේ නියුතු පොලිස් නිලධරයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මේවනවිට සැලසුම් කරමින් පවතී. එහි ආරම්භක වැඩසටහන් 2024 වර්ෂය තුළ පොලිස් නිලධරයන් දැනුවත් කිරීම සඳහා පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් සහභාගීවීමට සැලසුම් කර ඇත. එමෙන් ම කොමිෂන් සභාවේ කාර්යභාරය හා වගකීම් පිළිබඳව පොලිස් නිලධරයන් මෙන්ම මහජනතාව දැනුවත් කිරීමේ

වැඩසටහන් පැවැත්වීමට කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇති අතර මෙම කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යමය සහය ලබාගැනීමට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී.

නව කොමිෂන් සභාව සමාලෝචිත වර්ෂයේ කටයුතු ආරම්භ කරනවිට නව බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය සතුව නොමැතිවීම එම බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති විශාල අභියෝගයක් මෙන්ම බාධාවක් විය. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරමින් විවිධ උත්සාහයන් දැරුවද මෙතෙක් අපේක්ෂිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට නොහැකි වී ඇති අතර තවදුරටත් ඒ පිළිබඳව අවශ්‍ය උත්සාහයන් දරමින් සිටී. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය අතරින් ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණිවල අනුමත තනතුරු 11 න් තනතුරු 08ක් පුරප්පාඩුව පවතින අතර මුළු පුරප්පාඩු සංඛ්‍යාව 20 ක්ව පවතින අතර එම පුරප්පාඩු සඳහා අවශ්‍ය නිලධාරීන් ලබාදෙන ලෙස නිරන්තරයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කරමින් කටයුතු කරනු ලැබේ.

කෙසේ වුවද, මෙවැනි සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව ක්‍රියාත්මක වන ජාතික පොලිස් කොමිෂන් සභාව නව බලතල පැවරීමත් සමග රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යොමුකරන ලද ලිපිගොනු 10,000 කට අධික ප්‍රමාණයක කටයුතු සහ දෛනිකව ලැබෙන ඉල්ලීම් හා අභියාචනා ඉටුකිරීම සඳහා කඩිනමින් කටයුතු කර ඇත.

මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඇතුළු කොමිෂන් සභා සාමාජික මහත්ම මහත්මීන් නිරන්තරයෙන් උපදෙස් ලබාදෙමින් අනගි මඟ පෙන්වීමක් සිදුකරනු ලැබේ.

මීට අමතරව ඉඩකඩ සීමිත වීම, පරිගණක පහසුකම් ඇතුළු කාර්යාල උපකරණ අවම වීම, මූල්‍ය සහ ද්‍රව්‍යමය සම්පත්වල හිඟකම මත පොලිස් කොමිෂන් සභාව විසින් මුහුණ දෙමින් සිටි ගැටළු අවම කරගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව උපරිම සහයක් ලබාදී ඇති බවද කෘතවේදීව සිහිපත් කරමු.

**2023 වර්ෂයේ එනම්, 2023.01.01 සිට 2023.12.31 දක්වා ජාතික පොලිස් කොමිෂන් සභාවේ එක් එක් අංශ හා ඒකක විසින් ඉටුකර ඇති සමස්ත කාර්ය සාධනය සහ අත්පත් කරගෙන ඇති ප්‍රගතිය මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත.**

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස් සේවාවටත්, මහජනතාවටත් වඩාත් ඵලදායී කාර්යභාරයක් ඉටුකිරීමට අවශ්‍ය මූලික පියවර මෙම කෙටිකාලය තුළ ගෙන ඇත. ශ්‍රී ලංකාව රාජ්‍යයක් ලෙස ආර්ථික, දේශපාලන සහ සමාජීයීය වශයෙන් ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් පසුකරමින් සිටින කාලවකවානුවක වත්මන් ජාතික පොලිස් කොමිෂන් සභාව, ශක්තිමත් සහ ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස පිහිටුවීමේ ව්‍යවස්ථාදායක අභිප්‍රාය ඉටුකරනු වස් නිර්භයව සහ අපක්ෂපාතීව ස්වකීය ව්‍යවස්ථාදායක කාර්යභාරය වේගවත්ව ක්‍රියාත්මක කිරීමට කැපවී සිටී.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

"විශ්වසනීයවූත්, ස්වාධීනවූත්, වෘත්තීමය පොලිස් සේවයක් තුළින් සුරක්ෂිත, නිරුපද්‍රිත සහ සාමකාමී සමාජයක් නිර්මාණය කිරීමට සහාය වීම"

### මෙහෙවර

"මානව අයිතිවාසිකම්වලට ගරු කරමින්, නීතිය සහ සාමය පවත්වාගනිමින්, මහජන වගවීම සහතික කරමින්, නීතියේ ආධිපත්‍ය තහවුරු කරමින්, කාර්යක්ෂම, මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දක්වන සේවාවක් බවට ශ්‍රී ලංකා පොලිස් සේවය පරිණාමණය කිරීම."

### අරමුණු

පොලිස් සේවාවේ මානව සම්පත් ඵලදායී ලෙසත්, කාර්යක්ෂම ලෙසත් කළමනාකරණය කිරීම තුළින් ගුණාත්මක ප්‍රතිපත්ති සහ යහපත් පරිචයන් ක්‍රියාවට නංවමින්, වෘත්තීමය වශයෙන් උසස් සහ තෘප්තිමත් පොලිස් සේවයක් ඇති කිරීම.

කිසිදු නොමනා අගතියකින් හෝ අනුග්‍රහයකින් මෙන්ම වෙනස්කොට සැලකීමකින් තොරව මානව අභිමානය සහ නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව පොලිසියට එරෙහිව ඇති මහජන පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම මගින් මහජන අභිලාෂයන්ට ප්‍රතිචාර දැක්වීම සහ වගවීම.

මානව සුරක්ෂිතතාව ඇතිකිරීම සහ අපරාධ වැලැක්වීම අවධාරණය කරමින්, වෙනත් පාර්ශව කරුවන් සමග සමීප සහයෝගීතාවයකින් යුක්තව විවිධ පියවර සැලසුම් කරමින් සහ ක්‍රියාවට නංවමින් පොලිස් සේවයේ කාර්යක්ෂමතාව සහ ස්වාධිනත්වය වැඩි දියුණු කිරීම සඳහා සාකල්‍යමය ප්‍රවේශයක් අනුගමනය කිරීම.

### වටිනාකම්

ස්වාධීනත්වය

අවංකභාවය

වගවීම

අපක්ෂපාතීත්වය

සහයෝගීතාව

අඛණ්ඩ ඉගෙනුම

නිර්මාණශීලීත්වය

## 1.3. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනයේ 155 උ(1)(අ) වගන්තිය ප්‍රකාරව පොලිස් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල සහ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

(1) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත්කිරිම, උසස් කිරිම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරිමේ බලය ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් පොලිස් නිලධරයෙකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ සහ ඒවා විමර්ශනය කිරිමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක විධිවිධාන සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේය .

(3) පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයා විමසා පොලිස් නිලධාරින් සම්බන්ධයෙන් වූ පහත සඳහන් සියලු කාරණා සඳහා කටයුතු සැලසීමද, ඒ කාරණා නිශ්චය කිරීමද කරනු ලැබිය යුත්තේය.

  (අ) තත්කාර්ය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධාරින් බඳවා ගැනීම, උසස් කිරිම සහ ස්ථාන මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

  (ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩිදියුණු කිරිම;

  (ඇ) ජාතික හා පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවිආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය තීරණය කිරීම; සහ

  (ඈ) චර්යා සංග්‍රහය සහ විනය පිළිබඳ පටිපාටි සකස් කිරීම

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උප ලේඛනයේ I වන පරිශිෂ්ටයේ 1 වන ලැයිස්තුවේ සඳහන් පරිදි කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය හා කර්තව්‍ය ඉටු කිරිම ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

## 1.4 කොමිෂන් සභාවේ සංයුතිය

**සභාපති**

ඊ.ඩබ්ලිව්.එම්. ලලිත් ඒකනායක මහතා ( විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු)

**සාමාජිකයින්**


1. ඩී.කේ. රේණුකා ඒකනායක මහත්මිය (විශ්‍රාමලත් අමාත්‍යාංශ ලේකම්)
2. කනපතිපිල්ලේ කරුණාහරන් මහතා ( විශ්‍රාමලත් දිස්ත්‍රික් ලේකම්)
3. පී. ජී. සරත් ගාමිණී ද සිල්වා මහතා (විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති)
4. දිල්ෂාන් කපිල ජයසූරිය මහතා (ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ)
5. ඒ. ඒ. එම්. ඉල්ලියාස් මහතා (ජනාධිපති නීතිඥ)

**ලේකම්**

තමරා ඩී. පෙරේරා මහත්මිය (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණිය - විශ්‍රාමික)

# 1.5 සංවිධාන සටහන

**ජාතික පොලිස් කොමිෂන් සභාව**
**සංවිධාන ව්‍යුහය**



## 1.6 කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ සහ ඒකක

1. පරිපාලන පර්යේෂණ සහ සංවර්ධන අංශය
    1.1. නීති ඒකකය
    1.2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය
    1.3. මාධ්‍ය ඒකකය
2. මහජන පැමිණිලි විමර්ශන අංශය
3. ආයතන හා විනය අංශය
4. අභියාචනා අංශය
5. මූල්‍ය අංශය

## 1.7 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන අරමුදල්

පොලිස් කොමිෂන් සභාවට මෙය අදාළ නොවේ. (ජාතික පොලිස් කොමිෂන් සභාව ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ.)

## 1.8 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

මේ වන විට විදේශ ආධාර ලබා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වැනි ආයතන සමඟ සාකච්ඡා පැවැත්වෙන අතර ආධාර ලබා ගැනීම සඳහා උත්සුක වෙමින් සිටී.

# 02 පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## එක් එක් අංශවල ප්‍රගතිය, මුහුණදුන් අභියෝග සහ ඉදිරි ඉලක්ක

## 2.1. පාලන, පර්යේෂණ හා සංවර්ධන අංශය

### 2.1.1 පාලන අංශය

ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දෛනිකව ලැබෙන සියළුම ලිපි නියමිත පරිදි අංශ අතර බෙදාහැරීම හා කොමිෂන් සභාව සතු මානව සම්පත් කළමනාකරණය, නව නිලධාරීන් බඳවා ගැනීම, ඔවුන්ට අවශ්‍ය පුහුණුවීම් හා මග පෙන්වීම් ලබා දීම, කොමිෂන් සභාවට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ එදිනෙදා පරිපාලන කටයුතු ඉටුකිරිම, අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය, පරිපාලන අවශ්‍යතාවයන් සඳහා කොමිෂන් පත්‍රිකා සැකසීම හා ඊට අනුගත ක්‍රියා ඉටුකිරීම පාලන අංශය සතු ප්‍රධාන කාර්යයන් හා වගකීම් වන්නේය. මහජන පැමිණිලි විමර්ශන කටයුතු සඳහා පළාත් මට්ටමින් පිහිටුවා ඇති කාර්යාල සම්බන්ධයෙන් වන පරිපාලන කටයුතුද මෙම අංශයේ කාර්ය භාරයට ඇතුළත් වේ.

මෙම අංශය යටතේ කොමිෂන් සභාව සහ ජනමාධ්‍ය අතර කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක මාධ්‍ය ඒකකය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය ද ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභා කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය වැනි දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් හා සංවර්ධන නිලධාරි සේවය, රාජ්‍ය කලමනාකරණ සේවය හා තොරතුරු තාක්ෂණ සේවය වැනි ඒකාබද්ධ රාජ්‍ය සේවාවන් වලින් අනුයුක්ත නිලධාරින්ගෙන් සමන්විත වේ. පළාත් අධ්‍යක්ෂ තනතුරු සඳහා විශ්‍රාමික රජයේ විධායක සේවයේ නිලධාරින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම් සිදුකර ඇත. නීති නිලධාරි සහ මාධ්‍ය නිලධාරි යන තනතුරු සඳහා පොලිස් කොමිෂන් සභාව විසින් සෘජුවම නිලධාරින් බඳවාගෙන ඇත. තවද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් සේවයේ යෙදී සිටින නිලධාරින් ලබාගත නොහැකිවන අවස්ථාවලදී රා.ප.චක්‍රලේඛ 03/2018 අනුව විශ්‍රාමික නිලධාරින් ද කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවා පුරප්පාඩු තනතුරුවලට අනුයුක්ත කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ රාජකාරි වපසරිය පුළුල් වීම හේතුවෙන් එකී රාජකාරි ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අතිරේක කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවය පැන නැගිනි. ඒ අනුව මේ සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමෙන් පසු අතිරේක කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත. වගුව 1 මගින් 20 වන සහ 21 වන සංශෝධනය යටතේ අනුමත කාර්ය මණ්ඩල විස්තර දක්වා ඇත.

**20 වන සහ 21 වන සංශෝධන අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය- 2023**

වගුව 1

| අනු අංකය | තනතුර | 20 වන සංශෝධනය අනුව අනුමත සංඛ්‍යාව | 21 වන සංශෝධනය අනුව ඉල්ලුම් කරන ලද සංඛ්‍යාව | 21 වන සංශෝධනය අනුව අනුමත කළ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ලේකම් | 01 | 01 | 01 |
| 02 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 | 01 | 01 |
| 03 | අධ්‍යක්ෂ | 01 | 03 | 03 |
| 04 | පළාත් අධ්‍යක්ෂ (කොන්ත්‍රාත්) | 10 | 10 | 10 |
| 05 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ | 02 | 12 | 10 |
| 06 | සහකාර ලේකම් | 01 | 01 | 01 |
| 07 | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | 01 |
| 08 | අභ්‍යන්තර විගණක | 01 | 01 | 01 |
| 09 | නීති නිලධාරී (දෙපාර්තමේන්තුගත) | 01 | 01 | 01 |
| 10 | ප්‍රධාන විමර්ශන නිලධාරී (කොන්ත්‍රාත්) | 01 | 01 | 01 |
| 11 | නියෝජ්‍ය ප්‍රධාන විමර්ශන නිලධාරී | 00 | 01 | 00 |
| 12 | පරිපාලන නිලධාරී | 01 | 01 | 01 |
| 13 | භාෂා පරිවර්තක (සිංහල-ඉංග්‍රීසි) | 01 | 01 | 01 |
| 14 | භාෂා පරිවර්තක (දෙමළ-ඉංග්‍රීසි) | 01 | 01 | 01 |
| 16 | තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 | 01 | 01 |
| 17 | මාධ්‍ය නිලධාරී (දෙපාර්තමේන්තුගත) | 01 | 01 | 01 |
| 18 | සංවර්ධන නිලධාරී /විමර්ශන නිලධාරී සේවය | 24 | 30 | 34 |
| 19 | කළමනාකරණ සේවා නිලධාරී සේවය | 22 | 35 | 32 |
| 20 | තොරතුරු තාක්ෂණ සහකාර | 04 | 06 | 05 |
| 21 | කමිටු ලේකම් (කොන්ත්‍රාත්) | 01 | 01 | 01 |
| 22 | දත්ත සටහන් ක්‍රියාකරු (දෙපාර්තමේන්තුගත) | 01 | 01 | 01 |
| 23 | ඒකාබද්ධ රියදුරු සේවය | 06 | 10 | 06 |
| 24 | කාර්යාල සේවක සේවය | 13 | 20 | 13 |
| එකතුව | | **96** | **141** | **127** |

## 2023.12.31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල තොරතුරු

*වගුව 2*

| අනු අංකය | තනතුර | සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය | සේවයේ නියුතු | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | පුරප්පාඩු |
| 1 | ලේකම් | ශ්‍රී. ල.ප. සේ.වි.ශ්‍රේ. | 1 | SL-3 | | 1 | |
| 2 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී. ල.ප. සේ. 1 | 1 | SL-1 | * 1 | | |
| 3 | අධ්‍යක්ෂ | ශ්‍රී. ල.ප. සේ. 1 | 3 | SL-1 | # 3 | | |
| 4 | පළාත් අධ්‍යක්ෂ | කොන්ත්‍රාත් | 10 | 60,000.00 | | 10 | |
| 5 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී. ල.ග. සේ. 1 | 1 | SL-1 | 1 | | |
| 6 | අභ්‍යන්තර විගණක | ශ්‍රී. ල.ග. සේ. 11/111 | 1 | SL-1 | | | 1 |
| 7 | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී. ල.ප. සේ. 11/111 | 10 | SL-1 | 2 | | 8 |
| 8 | සහකාර /ලේකම් | ශ්‍රී. ල.ප. සේ. 111 | 1 | SL-1 | 1 | | |
| 9 | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | 1 | SL-1 | 1 | | |
| 10 | ප්‍රධාන විමර්ෂණ නිලධාරී | කොන්ත්‍රාත් | 1 | 60,000.00 | | | 1 |
| **එකතුව** | | | **30** | | 9 | 11 | 10 |
| 11 | පරිපාලන නිලධාරී | ක.සේ.නිල.අධි | 1 | MN-7 | 1 | | |
| 12 | භාෂා පරිවර්තක සි/ඉ | භා.ප. සේ | 1 | MN-6 | | | 1 |
| 13 | භාෂා පරිවර්තක සි/දෙ | භා.ප. සේ | 1 | MN-6 | 1 | | |
| 14 | තොරතුරු තාක්ෂණ නිලධාරි | තො.තා.සේ. | 1 | MN-6 | 1 | | |
| **එකතුව** | | | **4** | | 3 | 0 | 1 |
| 15 | මාධ්‍ය නිලධාරි | දෙපාර්තමේන්තුගත | 1 | MN-4 | 1 | | |
| 16 | විමර්ශන නිලධාරි/සං. නිලධාරි | සං.නිල.සේ. | 34 | MN-4 | 30 | | 4 |
| 17 | කළ. සේවා නිලධාරි | ක.සේ.නිල.සේ | 32 | MN-2 | 27 | 2 | 3 |
| 18 | තොරතුරු තාක්ෂණ සහකාර | තො.තා.සේ. | 5 | MT-1 | 4 | | 1 |
| 19 | කමිටු ලේකම් | කොන්ත්‍රාත් | 1 | 50,000.00 | | 1 | |
| **එකතුව** | | | **73** | | **62** | **3** | **8** |
| 20 | දත්ත සටහන් ක්‍රියාකරු | දෙපාර්තමේන්තුගත | 1 | MN-1 | 1 | | |
| 21 | රියදුරු | රියදුරු සේවය | 6 | PL-3 | 6 | | |
| 22 | කාර්යාල කාර්ය සහයක සේවය | කා.කා.සේ. | 13 | PL-1 | 12 | | 1 |
| **එකතුව** | | | **20** | | 19 | 0 | 1 |
| **මුළු එකතුව** | | | **127** | | **93** | **14** | **20** |

* වැඩ බැලීමේ පදනම වේ.
# එක් තනතුරක් වැඩ බැලීමේ පදනම වේ.

**2023.01.01 සිට 2023.12.31 දින දක්වා නිලධාරීන් පුහුණු පාඨමාලා සඳහා සහභාගි කරවීම**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ මානව සම්පත් සංවර්ධනය සහ ධාරිතා සංවර්ධනය උදෙසා 2023 ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා වන කාලය තුල ආයතනයේ සියලු කාර්ය මණ්ඩලය ඇතුලත් වන පරිදි පහත සඳහන් පුහුණු අවස්ථා ලබා දී ඇත.

*වගුව 3*

| අනු අංකය | පුහුණු පාඨමාලාව | සහභාගිත්වය |
|---|---|---|
| 1. | කළමනාකරණ සේවා නිලධාරි සේවාස්ථ ආරම්භක පුහුණු සැසිය ( දින 05 On line) 2023.02.20 – 2023.03.14 දින දක්වා | කසුනි වික්‍රමආරච්චි මෙය, චාමර ජිනසිංහ මයා, සමන්ත පුෂ්පකුමාර මයා |
| 2. | විශ්‍රාම වැටුප් සකස් කිරිම හා විශ්‍රාම ගැන්වීමට අදාළ කටයුතු සම්බන්ධ පුහුණුව ( පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමගින්) 2023.04.21 | ආයතන හා විනය අංශයන් හි සියළු කාර්ය මණ්ඩලය |
| 3. | කාර්ය පටිපාටික රීති සම්බන්ධ කාර්ය මණ්ඩල දැනුවත් කිරිම - සාකච්ඡාව 2023.07.04 | සියලුම මාණ්ඩලික නිලධාරීන් |
| 4. | ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදය පිලිබඳ කාර්ය මණ්ඩල සාකච්ඡාව 2023.08.02 හා 2023.08.22 | සියලුම මාණ්ඩලික නිලධාරීන් |
| 5. | තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩමුළුව . 2023.06.07 /08 දෙදින | කේමින්ද්‍ර රුබේරු මහතා තොරතුරු තාක්ෂණ නිලධාරි |
| 6. | විනය කටයුතු පිලිබඳ පුහුණුව 2023.08.11 දින (සම්පත්දායක රාධා නානායක්කාර මිය, ජ්‍යො.ස.ලේ. අධ්‍යාපන අමාත්‍යාංශය | ජාතික පොලිස් කොමිෂන් සභාවේ සියලු කාර්ය මණ්ඩලය |
| 7. | විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වන ලද නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරිම 2023.08.15 දින | සියලුම මාණ්ඩලික නිලධාරීන් |
| 8. | සාමාන්‍ය හැසිරීම සහ විනය ක්‍රියාමාර්ග පිලිබඳ පුහුණුව 2023.09.04 සිට 2023.09.08 - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | තනුජා එන් ප්‍රනාන්දු මිය (අධ්‍යක්ෂ) දිලංකා වික්‍රමසිංහ මිය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්) |
| 9. | කාර්යාල කලමනාකරණය හා මුදල් රෙගුලාසි | එම්.ඩබ්.කේ.සී.වික්‍රමාරච්චි මෙය<br>ශෂිකා මැවැල්ල මෙය සං. නිල.<br>ඒ.ආර්.එස්.සෙව්වන්දි මෙය<br>ඩී.ඒ.එස්.නුවන්මිණි මිය<br>ඩබ්.ඩී.එස්.එම්.වික්‍රමසිංහ මයා<br>සමන්ත පුෂ්පකුමාර මයා } කල. සේවා නිල. |
| 10 | ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය | තනුජා එන් ප්‍රනාන්දු මිය (අධ්‍යක්ෂ) දිලංකා වික්‍රමසිංහ මිය(ජෙ.ස.ලේ) ඕ.එම්.ඒ.එන් අරෝෂා මිය (කල.සේ.නි) |
| 11 | ධනාත්මක ආකල්ප, හා නායකත්ව කුසලතා | ලලිත් ධම්මික පෙරේරා මයා (සං. නිල.) |
| 12 | විනය හා කාර්යාල ආචාර විධි | සියලුම කාර්යාල සේවක සේවයේ කාර්ය මණ්ඩලය |
| 13 | කාර්යාල ආචාර විධි/ විනය හා මාර්ග නිති රීති | සියළුම රියැදුරු කාර්ය මණ්ඩලය |
| 14 | සාමාන්‍ය හැසිරීම සහ විනය ක්‍රියාමාර්ග පිලිබඳ පුහුණුව 2023.12 18 සිට 2023.12.22 -SLIDA | පරිපාලන නිලධාරි |
| 15 | කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය පිලිබඳ පුහුණු වැඩ සටහන 2023.12.18 /2023.12.22 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | සියලුම කලමනාකරණ සේවා නිලධාරීන් හා සියලුම සංවර්ධන නිලධාරි කාර්ය මණ්ඩලය |

**(2023-01-01 සිට 2023.12.31 දක්වා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ලැබී ඇති ඉල්ලීම් )**

| | | |
|---|---|---|
| ලැබී ඇති ඉල්ලීම් ගණන | - | 173 |
| තොරතුරු ලබා දී ඇති ඉල්ලීම් ගණන | - | 110 |
| ප්‍රතික්ෂේපිත ඉල්ලීම් ගණන | - | 07 |
| ක්‍රියාකරමින් පවතින ඉල්ලීම් ගණන | - | 56 |

### 2.1.2 පර්යේෂණ සහ සංවර්ධන අංශය

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ආරම්භ කර ඇති සහ ඉදිරියේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන නව වැඩසටහන් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීමට ලක් කිරීම මෙම අංශය සතු ප්‍රධාන ක්‍රියාත්මක කාර්යය සහ වගකීම වන්නේය.

### 2.1.3 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා සම්බන්ධ කටයුතු ඉටු කිරීම, නව වෙබ් අඩවිය නිර්මාණය කිරීම සහ යාවත්කාලීනව භාවිත කරන්නාට පහසු වන ආකාරයට පවත්වාගෙන යාමත් මෙම අංශයේ කාර්යභාරය වේ.

### 2.1.4 මාධ්‍ය ඒකකය

මෙම අංශය මගින් දිනපතා පළවන මාධ්‍ය වාර්තා පදනම් කරගනිමින් සතිපතා කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන අතර, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන් සහ ආයතන සමඟ යහපත් සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමට කටයුතු කරයි. එසේම කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වරින්වර මාධ්‍ය නිවේදන නිකුත් කරනු ලබන අතර මහජනයා හා පොලිස් නිලධාරින් දැනුවත් කිරීම ඉලක්ක කර ගනිමින් මාධ්‍ය සාකච්ජා සංවිධානය කරනු ලබයි. ඊට අමතරව උපායමාර්ග සැලසුම් සකස් කිරීම, වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කිරීම වැනි කොමිෂන් සභාවේ සියලු ප්‍රලේඛන කටයුතු ද මෙම අංශය මඟින් ඉටු කරයි.

### 2.1.5 නීති ඒකකය

පොලිස් නිලධාරින් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන මූලික අයිතිවාසිකම් පෙත්සම් පිළිබඳ ගරු නීතිපති වෙත නිරීක්ෂණ ඉදිරිපත් කිරීම, අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන රිට් පෙත්සම් පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම, ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අදාළව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය ඉදිරියේ ඇති සියලුම ගොනු සම්බන්ධයෙන් කටයුතු

කිරීම, ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අදාළව ඉදිරිපත් වන වෙනත් නීති කටයුතු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාදීම, කොමිෂන් සභාවේ අනෙකුත් අංශ ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින වෙනත් නෛතික අවශ්‍යතා සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සහ නඩු සම්බන්ධ ලිපිගොනු සහ නීති ඒකකයේ අනෙකුත් ගොනු සම්බන්ධ ලේඛන විධිමත්ව පවත්වා ගෙනයාම නීති අංශය මගින් ඉටුකරනු ලබයි.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විභාග කර අවසන් වූ සහ විභාග වෙමින් පවතින් නඩු ගොනු විස්තර 2023.01.01 – 2023.12.31 දක්වා**

*වගුව 4*

| වර්ෂය | ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | අභියාචනාධිකරණ නඩු | මුළු නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 2008 | 01 | 01 | 02 |
| 2009 | 02 | 00 | 02 |
| 2010 | 08 | 02 | 10 |
| 2011 | 04 | 00 | 04 |
| 2012 | 04 | 01 | 05 |
| 2013 | 03 | 03 | 06 |
| 2014 | 09 | 00 | 09 |
| 2015 | 14 | 01 | 15 |
| 2016 | 15 | 00 | 15 |
| 2017 | 12 | 00 | 12 |
| 2018 | 17 | 01 | 18 |
| 2019 | 39 | 07 | 46 |
| 2020 | 82 | 06 | 88 |
| 2021 | 30 | 03 | 33 |
| 2022 | 30 | 05 | 35 |
| 2023 | 23 | 10 | 33 |
| **මුළු එකතුව** | **293** | **40** | **333** |

**ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ දැනට පවතින නඩු වලට අදාළව අවසන් වූ නඩු ගොනු සහ ක්‍රියාකාරී නඩු ගොනු සංඛ්‍යාව - 2023.01.01 – 2023.12.31 දක්වා**

*වගුව 5*

| වර්ෂය | අවසන් වූ ගොනු | | ක්‍රියාකාරී ගොනු | |
|---|---|---|---|---|
| | අභියාචනාධිකරණ | ශ්‍රේෂ්ඨාධිකරණ | අභියාචනාධිකරණ | ශ්‍රේෂ්ඨාධිකරණ |
| 2008 | - | 01 | 01 | - |
| 2009 | - | 01 | - | 01 |
| 2010 | - | 07 | 02 | 01 |
| 2011 | - | 01 | - | 03 |
| 2012 | - | 02 | 01 | 02 |
| 2013 | 03 | 01 | - | 02 |
| 2014 | - | 07 | - | 02 |
| 2015 | 01 | 10 | - | 04 |
| 2016 | - | 07 | - | 08 |
| 2017 | - | 07 | - | 05 |
| 2018 | - | 07 | 01 | 10 |
| 2019 | 05 | 11 | 02 | 28 |
| 2020 | 02 | 17 | 04 | 65 |
| 2021 | 01 | 09 | 02 | 21 |
| 2022 | 02 | 13 | 04 | 16 |
| 2023 | - | 02 | 07 | 24 |
| | **14** | **103** | **24** | **192** |
| මුළු එකතුව | **117** | | **216** | |

**2023.01.01 සිට 2023.12.31 දක්වා නීති අංශයට ලිපි ලැබීම් හා පිළිතුරු සැපයීම්**

*වගුව 6*

| **මාසය** | **මාසය තුල ලිපි ලැබීම්** | **මාසය තුළ පිළිතුරු යැවූ ලිපි ගණන** | **මාසය තුළ පිළිතුරු නොයැවූ ලිපි** |
|---|---|---|---|
| ජනවාරි | 41 | 41 | 0 |
| පෙබරවාරි | 138 | 138 | 0 |
| මාර්තු | 77 | 71 | 6 |
| අප්‍රේල් | 30 | 29 | 1 |
| මැයි | 50 | 49 | 1 |
| ජුනි | 134 | 134 | 0 |
| ජූලි | 187 | 185 | 2 |
| අගෝස්තු | 136 | 135 | 1 |
| සැප්තැම්බර් | 146 | 144 | 2 |
| ඔක්තෝම්බර් | 83 | 79 | 4 |
| නොවැම්බර් | 91 | 89 | 2 |
| දෙසැම්බර් | 31 | 30 | 1 |
| **මුළු එකතුව** | **1144** | **1124** | **20** |

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් වී ඇති අභියාචනා ගොනු සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය - 2023.01.01 – 2023.12.31 දක්වා**

*වගුව 7*

| තනතුර | රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද ගොනු සංඛ්‍යාව | වැඩ නිම ගොනු සංඛ්‍යාව | 2023 වර්ෂයේ ජා.පො.කො.සභාව විසින් ආරම්භ කළ නව ගොනු සංඛ්‍යාව | ක්‍රියාත්මක මුළු ගොනු සංඛ්‍යාව | නිරීක්ෂණ ලබා දී ඇති ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| සහකාර පොලිස් අධිකාරී නිලය හා එම නිලයට ඉහළ නිලධාරීන්ගේ ලිපිගොනු | 121 | 22 | 35 | 134 | 26 |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලය හා එම නිලයට පහළ නිලධාරීන්ගේ ලිපිගොනු | 481 | 75 | 56 | 462 | 73 |
| එකතුව | **602** | **97** | **91** | **596** | **99** |

## 2.2 මහජන පැමිණිලි විමර්ශන අංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 උ (2) වගන්තිය අනුව මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ හා ඒවා විමර්ශනය කිරීමේ කාර්යය පරිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේදී පොලිස්පතිවරයාට කොමිසම විසින් ඒ බව වහාම දැනුම් දිය යුත්තේය. මෙම මහජන පැමිණිලි විමර්ශන කටයුතු ජාතික පොලිස් කොමිෂන් සභාවේ පැමිණිලි විමර්ශන අංශය විසින් සහ පළාත් නවයෙහි පිහිටා තිබෙන පළාත් කාර්යාල 9 කින් සිදු කරනු ලබයි.

**මහජන පැමිණිලි විමර්ශන අංශය මගින් ඉටුකරනු ලබන සේවාවන් : -**

- පැමිණිලි භාරගැනීම
- විමර්ශනය කිරීම.
- පැමිණිලිකරු දැනුවත් කිරීම.
- පොලිස් නිලධාරියෙකුගෙන් හෝ පොලිස් සේවයෙන් යම්කිසි රාජකාරි පැහැර හැරීමක් හෝ නීති විරෝධී කටයුත්තක් සිදුවී ඇත්නම් ඒ පිළිබඳව විනයානුකූලව කටයුතු කිරීමට කොමිෂන් සභාවේ තීරණය අනුව පොලිස්පති හෝ අදාල බලධාරීන් වෙත යොමු කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධයෙන් පොලිසිය විසින් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අනුව පොලිස් නිලධාරීන්හට උපදෙස් ලබාදීම.
- මහජන පැමිණිලි විමර්ශන අංශයේ නිලධාරීන් පුහුණු කිරීම.
- මහජන පැමිණිලි සිදුකරන ආකාරය පිළිබඳව ජනතාවට මාර්ගෝපදේශ ලබාදීම.
- කොමිෂන් සභාවට අදාළ නොවන පැමිණිලි සඳහා පැමිණිලිකරුවන්ව නිසි ආයතන වෙත යොමු කිරීම.
- 1960 ක්ෂණික ඇමතුම් සේවය මගින් පැය 24 පුරාම පැමිණිලිකරුවන්ට ක්ෂණික සහන ලබාදීම.

**2023 වර්ෂයේ මහජන පැමිණිලි විමර්ශන අංශයේ කාර්ය සාධනය**

2020 දෙසැම්බර් මස පත්වූ 06 වන ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2021 වසරේ දී හඳුන්වා දුන් නව මහජන පැමිණිලි විමර්ශන ක්‍රමවේදය 2022 වර්ෂයේ දී වඩාත් ක්‍රමවත්ව සහ විධිමත්ව පවත්වාගෙන යන ලද අතර ඒ අනුව 2023 වර්ෂයේදී ද මහජන පැමිණිලි විමර්ශනය වඩාත් ක්‍රමවත්ව සහ විධිමත්ව පවත්වාගෙන යන ලදී. විමර්ශන නිලධාරීන් මෙන්ම පළාත් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ (මහජන පැමිණිලි විමර්ශන) විසින්ද එම විමර්ශන ක්‍රමවේදය කොමිෂන් සභාවේ උපදෙස් පරිදි සහ වරින් වර කොමිෂන් සභාව මඟින් ලබාදෙන නියෝග පරිදි පවත්වාගෙන යන ලදී. ඒ අනුව පහත කාර්යයන් ඉටු කරන ලදී.

**I. නව පැමිණිලි භාර ගැනීම.**

පොලිස් නිලධාරියකුගෙන් හෝ පොලිස් සේවය මගින් යම් අසාධාරණයක් සිදු වී ඇති මහජනයාගෙන් යම් කෙනෙක් හෝ සිවිල් සංවිධානයක් හෝ ඔවුන්ගේ නියෝජිතයෙක්/ නීතිඥවරයෙක් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගනු ලබයි.

❖ පැමිණිලි ලැබෙන ක්‍රමවේදය.

(i). තැපැල මගින් යොමු කිරීමෙන්.

(ii). ෆැක්ස් කිරීම මගින්.

(iii). විද්‍යුත් තැපැල මගින්.

(iv). මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතිය වෙත ඇතුළත් කිරීම මගින්

(v). පැමිණ භාරදීම මගින්.

(vi). 1960 ක්ෂණික ඇමතුම් සේවයට දැනුම් දීම මගින්.

(vii). පළාත් කාර්යාල වෙත පැමිණ පැමිණිලි කිරීම.

**II. පැමිණිලි විමර්ශනය කිරීම.**

(i). ප්‍රධාන කාර්යාලයට ලැබෙන නව පැමිණිලි පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් විසින් අදාළ පළාත් කාර්යාලයට යොමු කිරීම.

(ii). ප්‍රධාන කාර්යාලයෙන් යොමු කරන පැමිණිලි සහ පළාත් කාර්යාල වලට ලැබෙන පැමිණිලි සඳහා ඒ ඒ පළාත් කාර්යාල මගින් ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම කරනු ලබන අතර ඉන්පසු බස්නාහිර පළාත හැර සෙසු පළාත් කාර්යාල මගින් ඒ පිළිබඳව අදාළ පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීම.

(iii). පැමිණිල්ලේ ස්වභාවය අනුව පළාත් සම්න්ධීකරණ නිලධාරීන් සහ විමර්ශන නිලධාරින් විසින් විමර්ශන සැලැස්ම සකස් කිරීම.

(iv). මූලික විමර්ශනය අදාළ පළාත් අධ්‍යක්ෂ විසින් සිදුකරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් සහ මහජන පැමිණිලි විමර්ශන අධ්‍යක්ෂ විසින් ලබා දෙනු ලැබේ.

**III. විමර්ශන අවසන් කිරීම.**

(i). පළාත් අධ්‍යක්ෂ මගින් විමර්ශන අවසන් කළ හැකි සියළු පැමිණිලි වලට අදාළ පළාත් අධ්‍යක්ෂගේ නිර්දේශිත වාර්තාව සහිතව ගොනු ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම.

(ii). අධ්‍යක්ෂ (මහජන පැමිණිලි විමර්ශන) විසින් එය අවසන් කල හැකිදැයි පරීක්ෂා කර, තවදුරටත් වාර්තා කැඳවා විමර්ශන සිදුකිරීමට හෝ විමර්ශන අවසන් කිරීමට හෝ කොමිෂන් පත්‍රිකාව සකස් කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සඳහා පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් වෙත උපදෙස් ලබා දීම.

(iii). අධ්‍යක්ෂ (මහජන පැමිණිලි විමර්ශන) ගේ නිර්දේශ ඇතුළත් කර කොමිෂන් සභා තීරණය ලබා ගැනීමට අදාළ කොමිෂන් පත්‍රිකාව සකස් කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම.

(iv). කොමිෂන් සභාවේ තීරණය පරිදි විමර්ශන කටයුතු අවසන් කිරීම හෝ සභාවේ උපදෙස් මත තව දුරටත් විමර්ශනය කිරීම සිදු කිරීම.

(v). 07 වන කොමිෂන් සභාවේ 2023.07.27 වන දින පැවති 12 වන කොමිෂන් සභා රැස්වීම් වාරයේ දී ලබා දුන් විශේෂ තීරණය මගින් එම තීරණයට ඇතුලත් පහත සඳහන්කොන්දේසි

වලට යටත් වන මහජන පැමිණිලි කොමිෂන් සභාවට ඉදිරිපත් නොකර එහි විමර්ශන අවසන් කිරීමේ හැකියාව අධ්‍යක්ෂ වෙත ලබා දී ඇත.

(i). සමථ මණ්ඩලයට ඉදිරිපත් කර සමථ වී ඇති පැමිණිලි.

(ii). දැනටමත් විසඳී ඇති පැමිණිලි.

(iii). තවදුරටත් විමර්ශන අවශ්‍ය නොවන බවට පැමිණිලිකරුවන්/ පැමිණිලිකාරියන් විසින් කොමිෂන් සභාව ලිඛිතව දැනුවත් කරනු ලබන පැමිණිලි.

(iv). කොමිෂන් සභාව විසින් තොරතුරු ඉදිරිපත් කරන ලෙස පැමිණිලිකරුවන්/ පැමිණිලිකාරියන් දිගින් දිගටම දැනුවත් කලද සිහි කැඳවීම් 3ක් ලබාදීමෙන් පසුව පවා ප්‍රතිචාර නොදක්වන පැමිණිලි.

ඒ අනුව එම තීරණයට යටත් වන පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කිරීම අධ්‍යක්ෂ විසින් සිදු කරයි.

**IV. (i). එක් එක් පළාත් කාර්යාල වලට අනුව 2023.01.01 වන දින සිට 2023.12.31 වන දින දක්වා කාලය තුල ලැබුණු පැමිණිලි සංඛ්‍යාව.**

***වගුව 8***

| පළාත | 2023 වර්ෂය තුලදී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර 1 | **569** |
| බස්නාහිර 11 | **433** |
| දකුණ | **332** |
| වයඹ | **221** |
| මධ්‍යම | **195** |
| සබරගමුව | **193** |
| උතුරු මැද | **160** |
| නැගෙනහිර | **130** |
| ඌව | **129** |
| උතුර | **86** |
| **එකතුව** | **2448** |

පෙර වර්ෂයට සාපේක්ෂව මහජන පැමිණිලි විමර්ශන අංශයට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 2023 වර්ෂය තුළ දී වැඩිවී ඇති බව පෙනී යන අතර ඒ අතරින් පැමිණිලි අඩකට ආසන්න සංඛ්‍යාවක් බස්නාහිර පළාතට අදාළව ලැබී ඇත. බස්නාහිර පළාත් කාර්යාලය 1 මඟින් සම්පූර්ණ කොළඹ දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි සහ බස්නාහිර පළාත් කාර්යාලය 11 මඟින් බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය හැර සෙසු සියළුම පොලිස් බල ප්‍රදේශ ආවරණය වන පරිදි මහජන පැමිණිලි විමර්ශනය සිදු කරනු ලබයි.

**2023.01.01** වන දින සිට **2023.12.31** වන දින දක්වා කාලය තුල දී ලැබුණු මහජන පැමිණිල්ලේ ස්වභාවය අනුව සංඛ්‍යාව

*වගුව 9*

| පැමිණිල්ලේ ස්වභාවය | 2023 වර්ෂයේ දී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| පොලිසිය විසින් ක්‍රියා නොකිරීම | 810 |
| බලය අයථා ලෙස පරිහරණය | 563 |
| පක්ෂග්‍රාහී වීම | 450 |
| අල්ලස් දූෂණ | 112 |
| බොරු චෝදනා කිරීම | 93 |
| මත්ද්‍රව්‍ය වැරදි | 55 |
| නීති විරෝධී ලෙස රඳවා ගැනීම | 34 |
| පහරදීම | 32 |
| වධහිංසා පැමිණවීම | 17 |
| කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 13 |
| පොලිස් අත්අඩංගුවේ සිටිය දී මරණ සිදුවීම | 3 |
| වෙනත් (මෙහි දක්වා ඇති පැමිණිල්ලේ ස්වභාවයන්ට අදාළ නොවන ලෙස ලැබී ඇති වෙනත් පැමිණිලි) | 266 |
| **එකතුව** | **2448** |

පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරණය කිරීම හා පක්ෂග්‍රාහීවීම යන පැමිණිලි වර්ග සඳහා වැඩි පැමිණිලි ප්‍රමාණයක් ලැබී ඇත.

**(iii) 2023.01.01 වන දින සිට 2023.12.31 වන දින දක්වා මහජන පැමිණිලි විමර්ශන අංශය මගින් මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ ප්‍රගතිය.**

**(අ) 2016, 2017, 2018, 2019 සහ 2020 වර්ෂවලට අදාළ මහජන පැමිණිලි විමර්ශනය**

*වගුව 10*

| වර්ෂය | 2023.01.01 වන දිනට විමර්ශන සිදු කිරීමට තිබූ සංඛ්‍යාව | විමර්ශනය අවසන් කර ඇති සංඛ්‍යාව | විමර්ශනය අවසන් කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| 2016 | 03 | 01 | 02 |
| 2017 | 00 | 00 | 00 |
| 2018 | 71 | 02 | 69 |
| 2019 | 94 | 11 | 83 |
| 2020 | 257 | 99 | 158 |
| **එකතුව** | **425** | **113** | **312** |

**(ආ) 2021 වර්ෂයට අදාළ මහජන පැමිණිලි විමර්ශනය :**

*වගුව 11*

| පළාත් කාර්යාලය | 2023.01.01 වන දිනට විමර්ශන සිදු කිරීමට තිබූ සංඛ්‍යාව | විමර්ශනය අවසන් කර ඇති සංඛ්‍යාව | විමර්ශනය අවසන් කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර 1<br>බස්නාහිර 11 | 353 | 85 | 268 |
| දකුණ | 124 | 79 | 45 |

| | | | |
|---|---|---|---|
| වයඹ | 27 | 11 | 16 |
| මධ්‍යම | 115 | 70 | 45 |
| සබරගමුව | 52 | 36 | 16 |
| උතුරු මැද | 35 | 14 | 21 |
| ඌව | 29 | 15 | 14 |
| නැගෙනහිර | 34 | 25 | 9 |
| උතුර | 53 | 25 | 28 |
| **එකතුව** | **822** | **360** | **462** |

**(ඇ) 2022 වර්ෂයට අදාළ මහජන පැමිණිලි විමර්ශනය :**

*වගුව 12*

| පළාත් කාර්යාලය | 2023.01.01 වන දිනට විමර්ශන සිදු කිරීමට තිබූ සංඛ්‍යාව | විමර්ශනය අවසන් කර ඇති සංඛ්‍යාව | විමර්ශනය අවසන් කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර 1 | 251 | 71 | 180 |
| බස්නාහිර 11 | 232 | 148 | 84 |
| දකුණ | 194 | 96 | 98 |
| වයඹ | 122 | 65 | 57 |
| මධ්‍යම | 128 | 42 | 86 |
| සබරගමුව | 101 | 66 | 35 |
| උතුරු මැද | 92 | 36 | 56 |
| ඌව | 69 | 45 | 24 |
| නැගෙනහිර | 55 | 21 | 34 |
| උතුර | 56 | 27 | 29 |
| **එකතුව** | **1300** | **617** | **683** |

**(ඇ) 2023 වර්ෂයට අදාළ මහජන පැමිණිලි විමර්ශනය :**

*වගුව 13*

| පළාත් කාර්යාලය | ලැබී ඇති මුළු සංඛ්‍යාව | විමර්ශනය අවසන් කර ඇති සංඛ්‍යාව | විමර්ශනය අවසන් කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර 1 | 569 | 140 | 429 |
| බස්නාහිර 11 | 433 | 155 | 278 |
| දකුණ | 332 | 68 | 264 |
| වයඹ | 221 | 36 | 185 |
| මධ්‍යම | 195 | 23 | 172 |
| සබරගමුව | 193 | 29 | 164 |
| උතුරු මැද | 160 | 55 | 105 |
| ඌව | 129 | 10 | 119 |
| නැගෙනහිර | 130 | 27 | 103 |
| උතුර | 86 | 18 | 68 |
| **එකතුව** | **2448** | **561** | **1887** |

**V. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ තොරතුරු පනතට අනුව මහජන පැමිණිලිවලට අදාළ තොරතුරු පැමිණිලිකරුවන්ට ලබා දීම :**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනුව පැමිණිලිකරුවන් විසින් ඉල්ලීම් කරනු ලබන ඔවුන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශන වලට අදාළ ලියවිලි පනතේ විධිවිධාන වලට යටත්ව ලබා දීම.

**VI. 1960 ක්ෂණික ඇමතුම් සේවය:**

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 1960 ක්ෂණික ඇමතුම් සේවය 2013 වර්ෂයේ අග භාගයේ දී ආරම්භ කර ඇති අතර මේ වන විට ඒ මඟින් පහත සඳහන් සේවාවන් ලබා දීම සිදු කරනු ලැබේ.

**(අ)** පොලිසියෙන් සේවාවක් ලබා ගැනීමේ දී අතෘප්තිමත්භාවයට පත්වන මහජනයා විසින් නාමිකව හෝ නිර්ණාමිකව සිදු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් පැමිණිල්ලේ ස්වභාවය අනුව සහ පැමිණිලිකරුගේ රහස්‍යභාවය සුරක්ෂිත වන පරිදි සේවය ලබා දීම.

**(ආ)** ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සහ සේවය පහ කිරීම දක්වා වූ විනය කටයුතු සම්බන්ධයෙන් සිදු කරනු ලබන අභියාචනා විමසීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම

වර්ෂයේ දින 365 ම සහ දවසේ පැය 24 ම මෙම සේවාව ලබා දෙනු ලැබේ.

**1960 ක්ෂණික ඇමතුම් සේවය ආරම්භ කරන ලද දිනයේ සිට මහජන පැමිණිලි සම්බන්ධයෙන් සේවය ලබා දීම සිදු කර ඇති අතර එම පැමිණිලි පහත සඳහන් චෝදනා සඳහන් කර ඉදිරිපත් කරනු ලබන පැමිණිලි වේ.**

**(අ).** පොලීසිය විසින් මහජන පැමිණිලි භාර නොගැනීම.

**(ආ).** පොලිස් ස්ථාන තුලදී පොලිස් පහරදීම් සිදුවීම.

**(ඇ).** පොලිස් නිලධාරීන් විසින් බලය අයථා ලෙස යොදා ගැනීම තුළින් පීඩාවට පත්වීම.

**(ඈ).** පොලිස් නිලධාරීන් කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම.

**(ඉ).** පොලිස් නිලධාරීන් බොරු චෝදනා මත අත්අඩංගුවට ගැනීම.

**(ඊ).** පොලිස් නිලධාරීන් පක්ෂග්‍රාහීව කටයුතු කිරීම.

**වත්මන් 07 වන කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ උපදෙස් මත 2023.10.13 වන දින සිට රාජ්‍ය නිවේදිත පොලිස් නිලධාරීන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් ආයතන හා විනය අංශය මඟින් සහ අනෙකුත් පොලිස් නිලධාරීන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අභියාචනා අංශයෙන් විමසීම් සිදු කර එම නිලධාරීන් දැනුවත් කිරීමට ද කටයුතු කරනු ලබයි.**

**(i). සේවය ලබා දෙන ආකාරය :**

**(අ).** ලැබෙන පැමිණිල්ල හෝ විමසීම පටිගත කරමින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.

**(ආ).** මහජන පැමිණිලි අංශය සම්බන්ධ විමසීම්, අදාළ පළාත් සම්බන්ධීකරණ නිලධාරි වෙත දැනුම් දීම.

**(ඇ).** රාජ්‍ය නිවේදිත පොලිස් නිලධාරීන්ගේ විමසීම්, ආයතන හා විනය අංශයේ අංශ ප්‍රධානීට දැනුම් දී එමඟින් කාරණය පිළිබඳ පවතින තත්ත්වය එම නිලධාරීන්ට දැනුම් දීම.

**(ඈ).** පොලිස් නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමසීම් සඳහා එම අවස්ථාවේදී ම අදාළ දත්ත පද්ධතිය පරීක්ෂා කර පවතින තත්ත්වය දැනුම් දීම.

**(ඉ).** එසේ දත්ත පද්ධතිය මඟින් තොරතුරු ලබා ගත නොහැකි අවස්ථාවල දී අදාළ අංශ ප්‍රධානී මඟින් තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව දැනුම් දීම.

**(ඊ).** මහජන පැමිණිලිකරුවන් සහ පොලිස් නිලධාරීන් විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවට තැපැල මඟින් යොමු කර ඇති පැමිණිලි සහ අභියාචනා හා ලිපි පිළිබඳව විමසීමේ දී තැපැල් අංශයේ දත්ත පද්ධතිය පරීක්ෂා කර එහි පවතින තත්ත්වය දැනුම් දීම.

## (ii).1960 ක්ෂණික ඇමතුම් අංකයට ලැබුණු ඇමතුම් සංඛ්‍යාව :

**2023.01.01 වන දින සිට 2023.12.31 වන දින දක්වා** *වගුව 14*

| මාසය | (2) මහජන පැමිණිලි | | | (3) පොලිස් නිලධාරීන්ගේ විමසීම් | | | | (4) කොමිෂන් සභා විෂය පථයට අදාළව ලැබුණු පැමිණිලි විමසීම් සංඛ්‍යාව (2+3) | (5) මහජනයා විසින් වෙනත් ආයතන සම්බන්ධයෙන් විමසීම් කරන ලද සංඛ්‍යාව | (6) 1960 ක්ෂණික ඇමතුම් දුරකථන සේවය වෙත ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව (4+5) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (I) පොලිස් ස්ථානාධිපති/ පොලිස් අධිකාරී සහ වෙනත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ක්ෂණිකව සහන ලබා දුන් සංඛ්‍යාව | (II) ක්ෂණිකව සහන ලබා දිය නොහැකි ගැටළු සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දුන් සංඛ්‍යාව | (III) මුළු සංඛ්‍යාව (2.I)+(2.II) | (I) අභියාචනා අංශය | (II) ආයතන හා විනය අංශය | (III) AAT අංශය | (IV) මුළු සංඛ්‍යාව (3.I)+(3.II)+(3.III) | | | |
| ජනවාරි | 60 | 282 | 343 | | | | | 343 | 423 | 766 |
| පෙබරවාරි | 59 | 222 | 281 | | | | | 281 | 472 | 753 |
| මාර්තු | 65 | 453 | 518 | | | | | 518 | 455 | 973 |
| අප්‍රේල් | 70 | 262 | 332 | | | | | 332 | 483 | 815 |
| මැයි | 69 | 381 | 450 | | | | | 450 | 440 | 890 |
| ජූනි | 31 | 211 | 242 | | | | | 242 | 329 | 571 |
| ජූලි | 10 | 215 | 225 | | | | | 225 | 432 | 657 |
| අගෝස්තු | 111 | 350 | 461 | | | | | 461 | 497 | 958 |
| සැප්තැම්බර් | 69 | 357 | 426 | | | | | 426 | 483 | 909 |
| ඔක්තෝබර් | 69 | 401 | 470 | 429 | 4 | 1 | 434 | 904 | 268 | 1172 |
| නොවැම්බර් | 37 | 145 | 182 | 664 | 2 | 2 | 668 | 850 | 171 | 1021 |
| දෙසැම්බර් | 70 | 410 | 480 | 1048 | 8 | | 1056 | 1536 | 139 | 1675 |
| එකතුව | 720 | 3689 | 4410 | 2141 | 14 | 3 | 2158 | 6568 | 4592 | 11160 |

**ඉටු කර ඇති ක්‍රියාකාරකම් :**

**(අ).** පොලීසියෙන් අගතියට පත්වූ මහජනතාවට සහ පොලිස් නිලධාරීන්ගේ විමසීම් සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වී ජාතික පොලිස් කොමිෂන් සභාවේ 1960 ක්ෂණික ඇමතුම් සේවය මඟින් 100% ඵලදායී ප්‍රශස්ථ සේවයක් ලබා දීමට අවශ්‍ය මැදිහත් වීම උපරිම ආකාරයෙන් ලබා දී ඇත.

**(ආ).** ලැබෙන පැමිණිලි වල අවශ්‍යතාවය අනුව විද්‍යුත් තැපැල මඟින් ද අදාළ පොලිස් ස්ථානාධිපති හෝ රාජ්‍ය නිවේදිත නිලධාරියකු වෙත යොමු කර ඇත.

**(ඇ).** එසේ යොමු කරන ලද පැමිණිලි 03ක් සම්බන්ධයෙන් කොට්ඨාශ භාර නිලධාරීන් විසින් කඩිනම් විමර්ශන සිදු කර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයකුට සහ උප පොලිස් පරීක්ෂකවරුන් දෙදෙනෙකුට හා කාන්තා උප පොලිස් පරීක්ෂක වරියන් දෙදෙනෙකුට එරෙහිව විනය පියවර ගැනීමට කටයුතු සිදු කර ඇත.

## 2.3. ආයතන හා විනය අංශය

ශ්‍රී ලංකා පොලිසියේ රාජ්‍ය නිවේදිත නිලධාරීන් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වන නිලධාරීන්ගේ ආයතන කටයුතු එනම් බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම් , ස්ථාන මාරු කිරීම්, සේවය ස්ථිර කිරීම්, වැඩ බැලීම/රාජකාරී ඉටු කිරීමට පත් කිරීම්, ද්විතීයන පදනම මත වෛද්‍යවරුන් බඳවා ගැනීම, විශ්‍රාම ගැන්වීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම සම්බන්ධ සියළු කටයුතු ආයතන හා විනය අංශයෙන් සිදු කරනු ලබයි.

එසේම, ආයතන හා විනය අංශය විසින් රාජ්‍ය නිවේදිත නිලධාරී බාණ්ඩයට අයත් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ඉහළ තනතුරු දරන සියළු නිලධාරීන්ගේ අභියාචනා පිළිබඳ කටයුතු ද සිදු කරනු ලබයි.

<u>ආයතන හා විනය අංශයට පැවරී ඇති කාර්යයන්</u>

1) ශ්‍රී ලංකා පොලිසියේ සාමාන්‍ය සහ විශේෂ කාර්ය බලකාය රාජ්‍ය නිවේදිත නිලධාරීන් වන සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරු දක්වා වන නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම් හා පෙරදාතම් කිරීම් සම්බන්ධව කටයුතු කිරීම.
2) රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධව කටයුතු කිරීම.
3) රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීම්, සේවයේ ස්ථිර කිරීම, විදේශ නිවාඩු අනුමත කිරීම, කොන්ත්‍රාත් පදනම මත සේවයේ පිහිටුවීම සම්බන්ධව කටයුතු කිරීම.
4) රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ විනය සම්බන්ධව කටයුතු කිරීම.
5) දේශපාලන පළිගැනීම්වලට ලක් වූ රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ අභියාචනා පිළිබඳව කටයුතු කිරීම.

**2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා මෙම අංශය මගින් ඉටුකරන ලද කාර්ය භාරය**

*වගුව 15*

| අනු අංකය | විස්තරය | ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව | ලබා දුන් තීරණ සංඛ්‍යාව | මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | **උසස් වීම් /පෙරදාතම් අභියාචනා** | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 142 | 62 | 80 |
| | ii. පොලිස් අධිකාරී | 204 | 169 | 35 |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 50 | 32 | 18 |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 16 | 16 | - |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 12 | 12 | - |
| 02 | **ස්ථාන මාරුවීම්** | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 64 | 64 | - |
| | ii. පොලිස් අධිකාරී | 21 | 21 | - |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 48 | 48 | - |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 26 | 26 | - |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 15 | 15 | - |

| | | | | |
|---|---|---|---|---|
| 03 | **ස්ථිර කිරීම** | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 103 | 93 | 10 |
| | | | | |
| 04 | **රාජකාරි ඉටුකිරීම සඳහා පත් කිරීම** | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | - | - | - |
| | ii. පොලිස් අධිකාරී | 01 | 01 | - |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 27 | 27 | - |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 27 | 27 | - |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 10 | 10 | - |
| 05 | **ස.පො.අ.සේවයේ පරිවාස කාලය දීර්ඝ කිරීම** | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 58 | 54 | 04 |
| | | | | |
| 06 | **විශ්‍රාම ගැන්වීම්** | | | |
| | i. සහකාර පොලිස් අධිකාරී | 52 | 52 | - |
| | ii. පොලිස් අධිකාරී | 19 | 18 | 01 |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 15 | 14 | 01 |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | - | - | - |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 01 | 01 | - |
| **එකතුව** | | **911** | **762** | **149** |

**<u>රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ විනය කටයුතු පිළිබඳ තොරතුරු (2023.01.01 සිට 2023.12.31 දක්වා)</u>**

*වගුව 16*

| 01 | **විනය කටයුතු සඳහා ලැබී ඇති ඉල්ලීම්** | **ලැබී ඇති අභියාචනා/ මේ වන විටත් කටයුතු ආරම්භ කර ඇති විනය ගොනුසංඛ්‍යාව** | **ලබා දුන් තීරණ සංඛ්‍යාව** | **තීරණ ලබා දිය යුතු ප්‍රමාණය** |
|---|---|---|---|---|
| | i. සහකාර පොලිස් අධිකාරී | 82 | 23 | 59 |
| | ii. පොලිස් අධිකාරී | 15 | 07 | 08 |
| | iii. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 27 | 09 | 18 |
| | iv. නියෝජ්‍ය පොලිස්පති | 09 | 06 | 03 |
| | v. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 08 | 07 | 01 |
| | වෙනත් පැමිණිලි | 09 | 01 | 08 |
| **එකතුව** | | **150** | **53** | **97** |

## 1.4. අභියාචනා අංශය

පොලිස් ස්ථානාධිපති වරුන්ගේ පත්වීම්, ස්ථාන මාරුවීම් හා විනය ක්‍රියාමාර්ග වලට අදාළ රාජකාරී, කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්හි නිලධාරීන් නැවත සේවයට බඳවා ගැනීමට අදාළ රාජකාරී සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන්ගේ අභියාචනා ලද පසු ඒවා ලේඛනගත කිරීම, පොලිස්පති වෙතින් වාර්තා කැඳවීම, කොමිෂන් පත්‍රිකා සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම, කොමිෂන් සභා තීරණ අදාල අභියාචකයන් වෙත දන්වා යැවීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. එමෙන්ම තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීම් කර ඇති පාර්ශවයන්ට අදාළ පරිදි තොරතුරු නිකුත් කිරීම ද මෙම අංශය මගින් ඉටුකරයි.

<u>අභියාචනා වර්ග</u>

- සේවය හැර ගිය නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සඳහා වන අභියාචනා
- වැඩ තහනම් කරන ලද නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සඳහා වන අභියාචනා
- පත්වීම අවලංගු කරන ලද නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම සඳහා වන අභියාචනා
- උසස්වීම් ලබා ගැනීම, උසස්වීම් පෙරදාතම කිරීම සහ වැරදි ලෙස සිදු කරන ලද උසස්වීම් වලට එරෙහි අභියාචනා
- විනය නියෝගයට එරෙහි අභියාචනා
- ස්ථාන මාරු ලබා ගැනීම, ස්ථාන මාරු අවලංගු කරවා ගැනීම සම්බන්ධ අභියාචනා
- විශ්‍රාම ගැන්වීම සම්බන්ධ අභියාචනා
- නැවත සේවයේ පිහිටුවීමේ දී ලබා දුන් කොන්දේසි සංශෝධනය කිරීම හා සම්බන්ධ අභියාචනා

පොලිස් ස්ථානාධිපතිවරුන් සම්බන්ධයෙන් පහත සඳහන් රාජකාරී වල දී පත්වීම් බලධාරියා සහ විනය බලධාරියා ලෙස කටයුතු කිරීම

i. පත්කිරීම් පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සහ අභියාචනා මණ්ඩල පත්කිරීමේ සිට ස්ථානාධිපති ධූර පිරිනැමීම දක්වා වූ ක්‍රියාවලිය සිදුකිරීම.

ii. ස්ථාන මාරුවීම් සිදුකිරීම හා ඒ පිළිබඳ අභියාචනා සලකා බැලීම.

iii. ස්ථානාධිපති තනතුරෙන් ඉවත් කිරීම.

iv. චෝදනා පත්‍රය ලබාදීම, විධිමත් විනය පරීක්ෂණය සිදුකිරීම සහ විනය නියෝග ලබාදිම දක්වා වූ සියලුම රාජකාරී

**<u>අභියාචනා අංශයේ කටයුතු පිළිබඳ සංඛ්‍යා ලේඛන :</u>**

I. අභියාචනා අංශය වෙත ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව - 2023.01.01 – 2023.12.31 දක්වා

*වගුව 17*

| කාල සීමාව | ලිපි සහ ගොනු සංඛ්‍යාව | |
|---|---|---|
| 2023.06.01 වන දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද ලිපි ගොනු සංඛ්‍යාව | 2990 | |
| 2023.06.01 වන දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද ලිපි සංඛ්‍යාව | 914 | |
| 2023.06.01 වන දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද මුළු ලිපි සහ ලිපි ගොනු සංඛ්‍යාව | | **3904** |
| **ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත 2023.01.01 සිට 2023.12.31 වන දින දක්වා ලැබී ඇති ලිපි.** | | |
| ජනවාරි | 545 | |
| පෙබරවාරි | 222 | |

| | | |
|---|---|---|
| මාර්තු | 328 | |
| අප්‍රේල් | 261 | |
| මැයි | 314 | |
| ජූනි | 633 | |
| ජූලි | 687 | |
| අගෝස්තු | 460 | |
| සැප්තැම්බර් | 525 | |
| ඔක්තෝම්බර් | 519 | |
| නොවැම්බර් | 533 | |
| දෙසැම්බර් | 471 | |
| **එකතුව** | | 5498 |
| අභියාචනා අංශය වෙත 2023.12.31 වන දිනට රාජකාරී කිරීම සඳහා පවතින ලිපි සහ ලිපි ගොනු සංඛ්‍යාව | | **9402** |

**II.** **<u>2023.01.26 වන දින සිට 2023.05.11 වන දින දක්වා කොමිෂන් පත්‍රිකා හා තීරණ ලබාදී ඇති නිලධාරීන් පිළිබඳ සංඛ්‍යාව - (06 වන කොමිෂන් සභාව)</u>**

*වගුව 18*

| **සභාවාරය** | **ඉදිරිපත් කරන ලද කොමිෂන් පත්‍රිකා ගණන** | **තීරණ ලබාදුන් නිලධාරින් සංඛ්‍යාව** |
|---|---|---|
| 82 වන සභාවාරයේ සිට 97 වන සභාවාරය දක්වා | 118 | 144 |

**III.** **<u>2023.05.16 වන දින සිට 2023.12.31 වන දින දක්වා කොමිෂන් පත්‍රිකා හා තීරණ ලබාදුන් නිලධාරින් සංඛ්‍යාව - ( 07 වන කොමිෂන් සභාව)</u>**

*වගුව 15*

| **විස්තරය** | **කොමිෂන් පත්‍රිකා ගණන** | **තීරණ ලබාදුන් නිලධාරීන් ගණන** |
|---|---|---|
| 2023.05.18 වන දිනැති 01 වන සභාවාරය සහ 2023.05.25 වන දිනැති 02 වන සභාවාරය | 13 | 12 |
| 2023.06.01 වන දිනැති 03 වන සභාවාරයේ සිට 2023.12.21 වන දිනැති 33වන සභාවාරය දක්වා | 405 | 637 |
| **එකතුව** | **418** | **649** |

## IV. 2023.06.01 වන දින සිට 2023.12.31 වන දින දක්වා වූ කොමිෂන් සභා සැසිවාර තුළ ඉදිරිපත් කර ඇති කොමිෂන් පත්‍රිකා සංඛ්‍යාව හා තීරණ ලබාදුන් නිලධාරීන් සංඛ්‍යාව:

*වගුව 19*

| දිනය | | කොමිෂන් පත්‍රිකා සංඛ්‍යාව (විෂය අනුව) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කොමිෂන් පත්‍රිකා සංඛ්‍යාව | 01.විනය නියෝග සංශෝධනය -DIS | 02.උසස්වීම - PRO | 03. ස්ථාන මාරුවීම - TRA | 04. විශ්‍රාමික -RET | 05. සේවය හැරයාම මත නැවත සේවයේ පිහිටුවීම -VOP | 06.රාජකාරි වැඩ තහනම් කිරීම මත නැවත සේවයේ පිහිටුවීම- INT | 07.පත්වීම අවලංගු කිරීම මත නැවත සේවයේ පිහිටුවීම - TER | 08. වෙනත් - OTHER | 09.පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ ස්ථාන මාරු සම්බන්ධව - OIC T | 10. පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ විනය - OIC /DIS | 11.පොලිස් ස්ථානාධිපති තනතුරේ සම්මුඛ පරීක්ෂණ - OIC Interview | 12.කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
| 01.06.2023 | 5 | 2 | | | | | 1 | | | 2 | | | | 15 |
| 07.06.2023 | 8 | 1 | 3 | | | 2 | 2 | | | | | | | 10 |
| 15.06.2023 | 16 | 2 | 6 | | | 4 | 1 | 1 | | 2 | | | | 19 |
| 22.06.2023 | 21 | 1 | 9 | | | 7 | 1 | 2 | | 1 | | | | 22 |
| 28.06.2023 | 3 | | 2 | | | | 1 | | | | | | | 20 |
| 06.07.2023 | 8 | | 3 | | | 2 | 1 | 1 | | 1 | | | | 119 |
| 13.07.2023 | 12 | 1 | 4 | | 2 | 3 | 2 | | | | | | | 12 |
| 20.07.2023 | 17 | 1 | 8 | 1 | | 3 | 2 | | | 2 | | | | 18 |
| 27.07.2023 | 14 | 1 | 4 | 1 | 1 | 2 | 2 | 2 | | 1 | | | | 16 |
| 03.08.2023 | 28 | 2 | 7 | 4 | 2 | 9 | | 4 | | | | | | 15 |
| 10.08.2023 | 21 | 3 | 6 | 1 | | 7 | | 3 | | 1 | | | | 28 |
| 17.08.2023 | 17 | | 12 | | | 2 | | 1 | 2 | | | | | 17 |
| 23.08.2023 | 12 | 1 | 1 | 1 | | 6 | 3 | | | | | | | 12 |
| 01.09.2023 | 9 | | 5 | 2 | | | 1 | | | | | | 1 | 21 |
| 08.09.2023 | 13 | | 6 | | 1 | 4 | 2 | | | | | | | 16 |
| 14.09.2023 | 16 | 1 | 6 | | 1 | 3 | 3 | 1 | | 1 | | | | 17 |
| 21.09.2023 | 12 | | 4 | | | 4 | | 1 | 1 | 2 | | | | 11 |
| 27.09.2023 | 7 | 1 | 1 | | | 2 | 1 | 1 | | | | 1 | | 9 |
| 04.10.2023 | 3 | | | | | | | | | 1 | | 2 | | 3 |
| 05.10.2023 | 14 | | 3 | 2 | | 3 | 3 | 1 | 2 | | | | | 13 |
| 12.10.2023 | 17 | 1 | 7 | | 1 | 3 | 2 | 1 | | | | 1 | 1 | 16 |
| 19.10.2023 | 13 | 1 | 3 | 3 | | 4 | 2 | | | | | | | 13 |
| 26.10.2023 | 17 | 2 | 5 | | 1 | 6 | 1 | | 1 | | | | 1 | 18 |
| 02.11.2023 | 19 | 1 | 3 | 2 | | 4 | 3 | 1 | 4 | | | 1 | | 21 |
| 09.11.2023 | 10 | | 4 | | | 5 | | | | | | | 1 | 11 |
| 16.11.2023 | 14 | 1 | 5 | | 2 | 3 | 1 | | 1 | | | 1 | | 14 |
| 23.11.2023 | 14 | 2 | 3 | 2 | | 3 | 2 | | | | | 2 | | 14 |
| 30.11.2023 | 15 | 1 | 5 | | 1 | 4 | 1 | 1 | | | | 2 | | 22 |
| 07.12.2023 | 16 | | 5 | 1 | 1 | 6 | 1 | 2 | | | | | | 41 |
| 14.12.2023 | 17 | 1 | 5 | 3 | | 5 | 3 | | | | | | | 18 |
| 21.12.2023 | 8 | | 5 | 2 | | 1 | | | | | | | | 49 |
| එකතුව | 416 | **27** | **140** | **25** | **13** | **107** | **42** | **23** | **11** | **14** | **0** | **10** | **4** | **650** |

## 2.5 මූල්‍ය අංශය

රජයේ මුදල් රෙගුලාසිවලට අනුකූලව ගිණුම් පවත්වාගෙන යාම සහ ඊට සම්බන්ධ අනෙකුත් කාර්යයන් ඉටු කිරීම ගිණුම් අංශය සතු කාර්යභාරයයි. ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයාදීමට මහා භාණ්ඩාගාරය සමඟ සෘජුවම කටයුතු කිරීම මෙම අංශයට පැවරී ඇත. අයවැය මඟින් වෙන් කර ඇති අරමුදල් මූල්‍ය අවශ්‍යතාවය මත ලබාදීම එහිදී සිදු කරනු ලබයි. අරමුදල් කළමනාකරණය, වියදම් පාලනය, කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයට සහ පළාත් කාර්යාල 09 සඳහා අවශ්‍ය වට්ටෝරු භාණ්ඩ, කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය සැපයීම මෙම අංශයට පැවරී ඇති කාර්යභාරයකි. මීට අමතරව පොලිස් කොමිෂන් සභාවේ සේවය කරන විවිධ සේවාවලට අයත් නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සහ අනෙකුත් වැය දැරීම් පිළිබඳ රාජකාරී ඉටු කිරීම ද මෙම අංශයේ තවත් වගකීමකි.

## 2.6 ජාතික පොලිස් කොමිෂන් සභාව 2023 වර්ෂයේ ලබා ඇති ජයග්‍රහණ, මුහුණ දුන් අභියෝග සහ ඉදිරි සැලසුම්

**2023 වර්ෂයේ දී ලබා ඇති ජයග්‍රහණ :**

1. නව කොමිෂන් සභාව 2023 වර්ෂයේ මැයි මස 16 වන දින පත්වීමෙන් අනතුරුව මාස 03 ක් ඇතුලත පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කර 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අනුව ජාතික කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරිම සඳහා විධිමත් ලෙස කටයුතු කර ඇත.
   i. අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2341/51 දරණ 2023 ජූලි 20 වෙනි දින දරණ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල අභිනියෝජනය කිරීම.
   ii. අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2345/46 දරණ 2023 අගොස්තු මස 16 දිනැති මහජන පැමිණිලි විමර්ශනය සඳහා වන කාර්ය පටිපාටික රීති ඇතුලත් ගැසට් පත්‍රය.
   iii. අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2345/45 දරණ 2023 අගොස්තු මස 16 දිනැති පොලිස් කොමිෂන් සභා අභියාචන කාර්ය පටිපාටික රිති ඇතුලත් ගැසට් නිවේදනය.
2. 1960 ක්ෂණික ඇමතුම් සේවය මඟින් 2022 වර්ෂයේදී ඇමතුම් 9774 ක සංඛ්‍යාවක් සඳහා කටයුතු කර ඇති අතර 2023 වර්ෂයේදී ඇමතුම් 11160 ක් සඳහා කටයුතු කර තිබීම අනුව 2022 වර්ෂයේ දී කටයුතු කළ ඇමතුම් සංඛ්‍යාව ඉක්මවා ඇමතුම් 1386 ක් සඳහා වැඩි සේවයක් 2023 වර්ෂය තුලදී ලබා දී ඇත.
3. මහජන පැමිණිලි විමර්ශන අංශයට අනුයුක්ත සියළුම නිලධාරීන්ගේ සහ පළාත් අධ්‍යක්ෂවරුන් යටතේ සිටින සියළුම නිලධාරීන්ගේ ප්‍රශස්ත සේවය ලබා ගැනීම මඟින් 2024 වර්ෂය තුළදී පැමිණිලි 2500 ක විමර්ශනය අවසන් කිරීම.

**මුහුණදුන් අභියෝග**

1. නව කොමිෂන් සභාව 2023 වර්ෂයේ එනම් සමාලෝචිත වර්ෂයේ කටයුතු ආරම්භ කරනවිට නව බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලය සතුව නොමැතිවීම එම බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පැවති විශාල අභියෝගයක් මෙන්ම බාධාවක් විය. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරමින් විවිධ උත්සාහයන් දැරුවද මෙතෙක් අපේක්ෂිත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට නොහැකි වී ඇති අතර තවදුරටත් ඒ පිළිබඳව අවශ්‍ය උත්සාහයන් දරමින් සිටී.
2. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය අතරින් ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/III ශ්‍රේණිවල අනුමත තනතුරු 11 න් තනතුරු 08ක් පුරප්පාඩුව පැවතීම.
3. විසි එක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවට බලතල පැවරීමෙන් පසුව ශ්‍රී ලංකා පොලිසියේ විධායක සේවා ගණයට අයත් නිලධාරීන්ගේ ක්‍රියාත්මක වෙමින් පැවති ලිපි ගොනු සහ ක්‍රියා කිරීමට ඇති ලිපි විශාල ප්‍රමාණයක් කොමිෂන් සභාව වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ලැබීම හේතුවෙන් ඒ සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක වීම සඳහා ඉහත කාර්ය මණ්ඩල හිගය අභියෝගයක් ලෙස පැවතීම.

**2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කරනු ලබන යෝජනා :**

1. පොලිස් කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීම.
2. නිලධාරීන්ගේ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අවශ්‍ය සියළු නිර්දේශිත වාර්තා ද සමඟ අදාල අභියාචනය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි කටයුතු විධිමත් කිරීම.
3. පොලිස් කොමිෂන් සභාව මඟින් ගනු ලබන තීරණ නිසි පරිදි ක්‍රියාත්මක වනවාද යන්න සොයා බැලීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම.
4. ශ්‍රී ලංකා පොලිසියේ විධායක සේවා ගණයේ නිලධාරීන්ට අදාල වන පත්වීම් බලධරයා ජාතික පොලිස් කොමිෂන් සභාව වන බැවින් එක් එක් නිලධාරියාට අදාල ලිපිගොනුවක් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යාම.
5. 1960 ක්ෂණික ඇමතුම් සේවාව මඟින් සේවය ලබා ගැනීම සඳහා 2023 වර්ෂය තුළදී ඇමතුම් 11160 ක් ලැබී ඇති අතර ඒ අනුව එම වර්ෂයේ එක් දිනක දී ඇමතුම් 80 ක් ලැබී ඇත. එවැනි සංඛ්‍යාවක ඇමතුම් මඟින් සේවය ලබා දීම සඳහා එක් නිලධාරිනියක් මඟින් කටයුතු කරනු ලබන අතර එම නිලධාරිනිය විසින් ලැබෙන සියළුම ඇමතුම් වලට අදාළ තොරතුරු පරිගණක ගත කිරීම සහ වාර්තා සකස් කිරීම ද දෛනිකව සිදු කරනු ලැබේ. එම කාර්යයන් එකම නිලධාරිනියක විසින් සිදුකිරීම මේවන විට අපහසු වී ඇති බැවින් 1960 සේවය සඳහා පූර්ණකාලීනව තවත් එක් නිලධාරියෙක් යෙදවීම.

6. ශ්‍රී ලංකා පොලිසිය මිත්‍රශීලී පොලීසියක් බවට පත් කිරීමේ අරමුණින් ප්‍රජා පොලිස් ඒකකයන් සමග සම්බන්ධ වී පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

7. ලිපි ද්‍රව්‍ය අවමකරණය සහ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා පොලිස්පති වාර්තා ලබා ගැනීම සහ කැඳවීම ජාලගත ආරක්ෂිත විද්‍යුත් තැපැල (VPN) මඟින් සිදුකිරීම.

8. මූලික විමර්ශන, විධිමත් විනය පරීක්ෂණ කටයුතු පිළිබඳව නිලධරයන් ධාරිතා වර්ධන වැඩසටහන් සහ අනෙකුත් අදාළ පුහුණුවීම් සඳහා යොමුකරවීම.

# 03 පරිච්ඡේදය
# 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | සත්‍ය 2023 රු. | සත්‍ය 2,022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 167,703,000 | 143,078,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 30,550 | 80,700 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 5,047,949 | 4,030,407 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 172,781,499 | 147,189,107 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 172,781,499 | 147,189,107 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 246,604 | 4,558 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 172,534,894 | 147,184,549 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | | |
| 77,313,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 76,420,559 | 71,319,373 | ඒසීඒ-2(ii) |
| 75,139,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 75,082,350 | 65,964,702 | ඒසීඒ-2(ii) |
| 446,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 445,043 | 439,706 | ඒසීඒ-2(ii) |
| 286,000 | පොලී ගෙවීම් | 8 | 285,693 | 579,297 | ඒසීඒ-2(ii) |
| 3,616,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 3,615,607 | 2,880,321 | ඒසීඒ-2(ii) |
| 156,800,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 155,849,252 | 141,183,399 | |
| | මූලධන වියදම් | | | | |
| 4,400,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 4,270,723 | 961,389 | ඒසීඒ-2(ii) |
| 4,850,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 4,835,783 | 3,204,279 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 500,000 | ධාරිතා වර්ධනය | 14 | 488,875 | 212,500 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| 9,750,000 | මුළු මූලධන වියදම් (උ) | | 9,595,382 | 4,378,168 | |
| | තැන්පතු ගෙවීම් | | 29,150 | 156,121 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 7,457,972 | 3,427,848 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 7,487,122 | 3,583,969 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 172,931,755 | 149,145,536 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | -396,861 | -1,960,986 | |
| | අග්‍රිම ලැබුම් ප්‍රකාශය අනුව ශේෂය | | -396,861 | -1,960,986 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | | ඒසීඒ-3 |
| | | | - | 0 | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 65,083,044.53 | 62,847,244.53 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 11,218,681.79 | 8,808,658.79 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **76,301,726.32** | **71,655,903.32** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 11,210,731.79 | 8,802,108.79 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 65,083,044.53 | 62,847,244.53 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 7,950.00 | 6,550.00 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **76,301,726.32** | **71,655,903.32** |

පිටු අංක 01 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 52 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඒවා අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2024.02.26 | දිනය : 2024.02.26 | දිනය : 22/02/2024 |
| තමරා ඩී. පෙරේරා<br>ලේකම්<br>ජාතික පොලිස් කොමිෂන් සභාව | තමරා ඩී. පෙරේරා<br>ලේකම්<br>ජාතික පොලිස් කොමිෂන් සභාව | ඩී. එල්. ඩී. පුවිත<br>ප්‍රධාන ගණකාධිකාරී<br>ජාතික පොලිස් කොමිෂන් සභාව |

2

# 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-3

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන 2023 රු. | 2022 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| බදු ලැබීම් | - | - |
| ගාස්තු, දඩ, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 2,962,729 | 2,535,190 |
| වෙනත් ආදායම් කිරීම වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| ඉම්ප්‍රස්ට් ලැබීම් | 167,703,000 | 143,078,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 8,067,047 | 3,576,124 |
| තැන්පතු ලැබීම් | 30,550 | 80,700 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 178,763,326 | 149,270,014 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල වේතන හා මෙහෙයුම් වියදම් | 155,081,476 | 140,677,193 |
| සහනාධාර සහ මාරුකිරීම් | 445,043 | 439,706 |
| වෙනත් වැය කිරීම වෙනුවෙන් දරන ලද වියදම් | 5,829,725 | 186,420 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 246,604 | 4,558 |
| අත්තිකාරම් ගෙවීම් | 7,535,946 | 3,427,849 |
| තැන්පතු ගෙවීම් | 29,150 | 156,121 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 169,167,945 | 144,891,847 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | 9,595,382 | 4,378,168 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| වත්කම් ඉවත්කිරීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| ප්‍රාග්ධන අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| ප්‍රාග්ධන වියදම් | 9,595,382 | 4,378,168 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 9,595,382 | 4,378,168 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | -9,595,382 | -4,378,168 |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | 0 | 0 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | 0 | 0 |
| විදේශීය ණය ගැනීම් | 0 | 0 |
| ප්‍රදානයන් ලැබීම් | 0 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | 0 | 0 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | 0 | 0 |
| විදේශීය ණය ආපසු ගෙවීම් | 0 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | 0 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | 0 | 0 |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | 0 | 0 |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | 0 | 0 |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | 0 | 0 |

3

## 3.4 මුල්‍ය ප්‍රකාශ සටහන්

මුල්‍ය ප්‍රකාශනවල ඇති ඉහත සියලු අගයන් භාණ්ඩාගාර ප්‍රකාශන සමඟ සැසඳේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20.02.02.99 (12202099) | පොලිය-වෙනත් | . | | 448 | |
| 20.03.99.00 (12399000) | අනිකුත් ලැබීම් | . | | 110 | |
| 20.04.01.00 (12401000) | වැ.අ.වි.වැටුප් දායක මුදල් | | | 2,313 | අදාල නොවේ. |
| 2002.01.01 (12201001) | රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම් -රජයේ ගොඩනැගිලි | | | 91 | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 156,800 | 156,800 | 155,849 | 99.39 |
| ප්‍රාග්ධන | 4,700 | 9,750 | 9,595 | 98.41 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තුමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදනලද අමාත්‍යාංශය/ දෙපාර්තුමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාද න | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | | 5,756 | 5,756 | 5,747 | 99.8 |

## 3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | නැත. | නැත. | නැත. | |
| 9152 | යන්ත්‍රෝපකරණ | 65,083 | 65,083 | නැත. | 100 |
| 9153 | ඉඩම් | නැත. | නැත. | නැත. | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | නැත. | නැත. | නැත. | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | නැත. | නැත. | නැත. | |
| 9160 | ක්‍රියාත්මක වන වැඩ | නැත. | නැත. | නැත. | |
| 9180 | බදු දෙන ලද වත්කම් | නැත. | නැත. | නැත. | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/D/NPC/SR/2023    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2024 මැයි 15 දින

ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව

**ශීර්ෂය 008 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 008 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

2

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනම සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරිම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව රජයේ වියදම් වඩාත් අරපිරිමැසුම්දායි ලෙස භාවිතා කිරීම හා අත්‍යාවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කිරීමේ අරමුණින් 2023 වසර සඳහා අයවැය මගින් වෙන්කර ඇති පුනරාවර්තන වියදම් අවම වශයෙන් සියයට 6 කින් කපා හැරීමට  අමාත්‍ය මණ්ඩල විසින් තීරණය කර ඇති බවත්, ඒ අනුව 1001,1204,1404,1502,1601,1602 හා 1603 හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් කටයුතු කළ යුතු බව දන්වා තිබුණද පොලිස් කොමිෂන් සභාව ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ආ) වැය විෂයයන් 5 ක් සඳහා මුදල් රෙගුලාසි 208 යටතේ එකතුව රු.5,755,825 ක් වූ අමතර ප්‍රතිපාදන සලසාදී තිබුණි. වෙනත් දීමනා (1003) සහ වෙනත් (1409) වැය විෂයය සඳහා මේ යටතේ පිළිවෙලින් රු.1,975,525 ක් හා රු.450,000 ක අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණද පිළිවෙලින් රු.475,000 ක් හා රු.384,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

4

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) මහජන පැමිණිලි විමර්ශනය

(I) 2023 වර්ෂයේ ලද මහජන පැමිණිලි 2448 න් පැමිණිලි 561 ක එනම් සියයට 23 ක විමර්ශන අවසන් කර ඇති අතර, මහජන පැමිණිලි 1887 ක එනම් සියයට 77 ක විමර්ශන අවසන් කර නොතිබුණි. පළාත් අනුව ලද මහජන පැමිණිලි විමර්ශනය තුළින් වර්ෂය තුළ අවම වශයෙන් සියයට 25 ක ප්‍රගතියක් ලබාගැනීමට නොහැකි වූ පළාත් ගණන 8 ක් වූ අතර, ඉන් ඌව පළාතේ පැමිණිලි විමර්ශනය කිරීමේ ප්‍රගතිය සියයට 8 ක් පමණ අඩු ප්‍රතිශතයක පැවතුණි.

(II) ලද මහජන පැමිණිලි ස්වභාවය අනුව මුළු පැමිණිලිවලින් වැඩිම ප්‍රතිශතයක් වූයේ පොලිසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා ලෙස පරිහරණය, පක්ෂග්‍රාහී වීම යන ස්වභාවයේ පැමිණිලි වූ අතර එය මුළු සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 33, 30,18 ක් පමණ විය. එම පැමිණිලි විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 24, 25 හා 17 ක අඩු ප්‍රතිශතයක පැවතුණි.

(III) පහරදීම, නීති විරෝධී ලෙස රඳවා ගැනීම, වද හිංසා පැමිණ වීම හා බොරු චෝදනා කිරීම යන ස්වභාවයේ මහජන පැමිණිලි විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 6, 6, 12 හා 13 ක් ලෙස අඩු ප්‍රතිශතයක පැවතුණි.

(IV) 2016-2022 කාල පරිච්ඡේදයේ ලද පැමිණිලිවලින් 2023 ජනවාරි 01 වන දිනට පැමිණිලි 2547 ක් විමර්ශනය සිදු කිරීමට තිබූ අතර, ඉන් පැමිණිලි 1090 ක් එනම් සියයට 43 ක් අවසන් කර තිබුණු අතර, 1457 ක් එනම් සියයට 57 ක් පැමිණිලි අවසන්ව නොතිබුණි. මෙලෙස වාර්ෂිකව ලැබෙන මහජන පැමිණිලි ඒ ඒ වර්ෂවලදී විමර්ශන අවසන් නොවී අඛණ්ඩව විශාල ප්‍රමාණයක් ඉදිරියට රැගෙන යාම මත පැමිණිලි සිදු කරනු ලබන මහජනතාවට කාර්යක්ෂම සේවයක් ඉටු නොවන තත්ත්වයක් පැවතුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතින නඩු 216 ක් පවතින අතර, ඊට අමතරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය යටතේ ක්‍රියාත්මක ගොනු 596 ක් පැවතුණි. එම ගොනු 596 න් 99 ක් සඳහා පමණක් නිරීක්ෂණ ලබාදී තිබුණි.

(ඇ) 2023 වර්ෂයේ ආරම්භ කළ විනය ගොනු 150 න් 53 ක තීරණ ලබාදී ඇති අතර එහි ප්‍රගතිය සියයට 35 ක් පමණ විය. ඉන් සහකාර පොලිස් අධිකාරීවරුන් සම්බන්ධව ඉහළම විනය කටයුතු සම්බන්ධ පැමිණිලි 82 ක් ලැබී ඇති අතර ඉන් 23 ක් පැමිණිලි සඳහා තීරණ ලබාදීම මත ප්‍රගතිය සියයට 23 ක අඩු අගයක් ගෙන තිබුණි.

(ඇ) අභියාචනා අංශයේ සංඛ්‍යා ලේඛන අනුව 2023 දෙසැම්බර් 31 දිනට රාජකාරි කිරීම සඳහා පවතින ලිපි සහ ලිපි ගොනු සංඛ්‍යාව 9402 ක් විය. ඉන් 2023 ජූනි 01 වන දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලද මුළු ලිපි සහ ලිපි ගොනු සංඛ්‍යාව 3904 ක් ද ජාතික පොලිස් කොමිෂමට 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ ඇති ලිපි ගණන 5498 ක් ද විය. ලිපි 9402 තුළ පොලිස්පති වාර්තා, තොරතුරු කැඳවීම් ලිපි, අභියාචනා ආදී ලිපි ලේඛන සියල්ලම ඇතුළත් වන අතර අංශය මගින් විගණිත දිනය වන විටත් අදාළ සංඛ්‍යාවෙන් අභියාචනා ගණන ලද පොලිස්පති වාර්තා ගණන ආදී ලෙස හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණි. ඒ අනුව අංශයේ ප්‍රගතිය අංශය මගින් වර්ෂය තුළ ලබාදුන් කොමිෂන් සභා තීරණ මත පමණක් පදනම්ව පැවතුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

අධිකරණ අමාත්‍යාංශයට අයත්ව තිබූ කාර් රථයක් 2022 මාර්තු 21 දින ජාතික පොලිස් කොමිෂන් සභාවට පවරාගෙන වසර දෙකක් ගතවී තිබුණ ද, මෙම මෝටර් රථය තක්සේරු කර වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

## 3.3 පාඩු හා හානි

2023 වර්ෂයේදී වාහන 03 කට අනතුරු සිදුවී තිබුණද, මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව එම හානි සම්බන්ධයෙන් හානි පිළිබඳ ලේඛනයේ සටහන්කර නොතිබූ අතර , හානියේ වටිනාකම සහ එම හානිය රක්ෂණයෙන් ප්‍රතිපූරණය කිරීම පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි.

6

3.4 කළමණාකරණ දුර්වලතා

මූලස්ථාන පොලිස් පරීක්ෂක/ පොලිස් ස්ථානාධිපති තනතුරු සඳහා සුදුසු නිලධරයන් තෝරාගැනීමේ සම්මුඛ පරීක්ෂණයක් 2023 වර්ෂයේ පවත්වා තිබුණද, පොලිස්පතිගේ අංක DIG/HRM/OW/127/224 හා 2024 පෙබරවාරි 05 දිනැති ලිපියේ කරුණු සැලකිල්ලට ගෙන 2024 පෙබරවාරි 15 දින කොමිෂන් සභා තීරණය මත එම සම්මුඛ පරීක්ෂණය අවලංගු කිරීමට තීරණය කර තිබුණි. මෙම තත්ත්වය තුළ 2023 හා 2024 වර්ෂයේ මේ දක්වා සිදුකර තිබූ මූලස්ථාන පොලිස් පරීක්ෂක/පොලිස් ස්ථානාධිපති පත්වීම්වලට අදාළව නිලධාරීන් තෝරා ගැනීමේදී විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කර නොතිබූ අතර, මූලස්ථාන පොලිස් පරීක්ෂක/ ස්ථානාධිපති තනතුරු සඳහා සුදුසුම නිලධාරීන් පත් නොවීමට අවස්ථාව පැවතුණි.

4. යහ පාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත ප්‍රමාණය | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | සංඛ්‍යාව |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 07 | 11 | 12 |
| තෘතීයික මට්ටම | 04 | 03 | - | 01 |
| ද්විතීක මට්ටම | 74 | 63 | 03 | 08 |
| ප්‍රාථමික මට්ටම | 19 | 18 | - | 01 |
| එකතුව | 127 | 91 | 14 | 22 |

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධ්‍යක්ෂ, ප්‍රධාන විමර්ශන නිලධාරී, අභ්‍යන්තර විගණක යන තනතුරු එක් නිලධාරියෙක් බැගින් පුරප්පාඩුව් තිබුණි.

(ආ) සහකාර අධ්‍යක්ෂ තනතුරු 08 ක් පුරප්පාඩුව පැවතුණි. කොමිෂන් සභාවේ විවිධ අංශයන් යටතේ මේ වන විටත් පවතින අවසන් නොවූ මහජන පැමිණිලි , අභියාචනා හා විනය සම්බන්ධ ලිපිගොනු කඩිනමින් නිම කිරීම මගින් ප්‍රමාදය වැලැක්වීමටත්, කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණු ඉටු කරගැනීමට මෙම තනතුරු කඩිනමින් පිරවිය යුතු බවත් පුරප්පාඩු පැවතීම කොමිෂමේ කාර්ය සාධනයට දැඩි ලෙස බලපාන බවත් විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඇ) කාර්යක්ෂම ලෙස නීති ඒකකයේ කටයුතු ඉටු කිරීමට, අනුමත කාර්යය මණ්ඩලය තුළ එක් නීති නිලධාරී තනතුරක් පමණක් අනුමතව පැවතීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

RSKL

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

8

# 04 පරිච්ඡේදය
# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරකම් සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| පොලිසියට එරෙහිව පොලිස් නිලධාරින් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි හා අපරාධ ස්වභාවයක් ගන්නා පැමිණිලි විමර්ශනය කිරීම සඳහා විශේෂ විමර්ශන ඒකකයක් ස්ථාපනය කිරීම. | | ✓ | |
| රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු වීම් සහ විනය කටයුතු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා/ඉල්ලීම් සඳහා සාධාරණ කාලයක් ඇතුළත සහන සැලසීම. | ✓ | | |
| රාජ්‍ය නිවේදිත නොවන නිලධාරීන්ගේ සහ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු වීම් සහ විනය කටයුතු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා/ඉල්ලීම් සඳහා සහන සැලසීමේ ප්‍රගතිය | | ✓ | |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරයේ සහ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ පවතින නඩු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය | | ✓ | |
| ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබෙන සියලු මහජන පැමිණිලි විමර්ශනය කිරීම සහ සහන සැලසීම. | | ✓ | |
| 1960 දුරකථන අංකයට ලැබෙන ඇමතුම්/ඉල්ලීම් සඳහා සහන සැලසීමේ ප්‍රගතිය | ✓ | | |
| කාර්ය මණ්ඩලය දැනුමින්, කුසලතාවලින් සහ ආකල්ප වලින් සන්නද්ධ කරනු වස් ඔවුන් සඳහා පුහුණු සැලැස්මක් පිළියෙල කිරීම. | ✓ | | |
| කොමිෂන් සභාවේ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | | | ✓ |
| මහජනයාට හා පොලිස් නිලධාරින්ට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකිවන පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම. | | ✓ | |

| | | | |
|---|---|---|---|
| තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මහජනයා හා පොලිස් නිලධාරින් විසින් කර ඇති සියලු තොරතුරු ඉල්ලීම සඳහා අවසන් ප්‍රතිචාර දැක්වීම. | | √ | |
| පාර්ලිමේන්තුවට සහ ජනාධිපති කාර්යාලය වෙත යොමුකළ යුතු පරිපාලන වාර්තා කලට වේලාවට යැවීම. | √ | | |
| ජාතික පුවත්පත් වෙත ප්‍රවෘත්ති/නිවේදනයක් නිකුත් කිරීම. | | √ | |

# 05 පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| SDG ඉලක්ක 16<br>ජාතික ව්‍යවස්ථාපිත නීතිවලට අනුකූලව (තොරතුරු දැනගැනීමේ පනත) තොරතුරු දැනගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම. | මහජනයා හා පොලිස් නිලධාරින් විසින් ඉල්ලා සිටින තොරතුරු ඉල්ලීම් සියල්ලටම ප්‍රතිචාර දැක්වීම. | 2023 වර්ෂය තුළ ඉදිරිපත් වූ තොරතුරු ඉල්ලීම් 173 කින් ඉල්ලීම් 110 කට අදාලව තොරතුරු ලබා දී ඇති අතර ඉල්ලීම් 07 ක් ප්‍රතික්ෂේප කර ඇත. | | | ✓ |
| සෑම මට්ටමකදීම වගකීමට බැඳී සිටින සහ විනිවිදභාවයකින් යුත් ඵලදායී ආයතන සංවර්ධනය කිරීම. | ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා මහජන උපායමාර්ග සංවර්ධනය කිරීම. | | | | ✓ |
| සියලු මට්ටමකට ධාරිතා සංවර්ධනය සඳහා අන්තර්ජාතික සහයෝගීතාවය තුළින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ සමස්ත ධාරිතාව සංවර්ධනය කිරීම. | දේශීය හා විදේශීය කාර්යාල පුහුණුව හරහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ දැනුම කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම. | වේගවත් සේවා සම්පාදනයට මහජන අභියාචනාවන්ට ක්ෂණික ප්‍රතිචාරය වේගවත් සහනය ලබාදීම. | | ✓ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාල තිරසර සංවර්ධන ඉලක්ක වන්නේ SDG ඉලක්ක 5,16 17 වේ. එනම් 5 - ස්ත්‍රීපුරුෂ සමාජභාවී සමානාත්මතාවය, 16 - සාමය යුක්තිය සහ ශක්තිමත් ආයතන, සහ 17 - ඉලක්ක සපුරාගැනීම සඳහා හවුල්කාරීත්වය වේ. මෙම ඉලක්ක සපුරා ගැනීමේදී ජාතික පොලිස් කොමිෂන් සභාවට අභියෝග ගණනාවකට මුහුණපෑමට සිදුවිය. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය නිරන්තරයෙන් වෙනස්වීම හේතුකොට ගෙන මෙම ඉලක්ක සපුරාගැනීමේ උපායමාර්ග සැලසුම්වලට බාධා ඇතිවිය. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සහ මූල්‍ය අනුග්‍රහය යටතේ 2016 සිට ක්‍රියාත්මක කළ වැඩසටහන් 20 වන සංශෝධනයත් සමඟ අඩාල වූ අතර නැවත 21 වන සංශෝධනයෙන් බලතල ලැබීමත් සමග ඉහත වැඩසටහන් තුළින් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා මේ වනවිට කටයුතු සැලසුම් කරමින් පවතී.

# 06 පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 30 | 20 | 10 |
| තෘතීයික | 04 | 03 | 01 |
| ද්විතීයික | 73 | 65 | 08 |
| ප්‍රාථමික | 20 | 19 | 01 |

## 6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සඳහා අදාල පත්වීම් බලධාරීන් විසින් නිලධාරීන් ලබා නොදීම නිසා දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

කාර්යාලීය අවශ්‍යතා පදනම් කරගනිමින් සියළුම කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ඇතැම් ක්ෂේත්‍ර සඳහා විශේෂයෙන්ම නව තාක්ෂණික දැනුම පිළිබඳ පුහුණුව කාර්ය මණ්ඩලය වෙත ලබාදීමට නිරන්තරව කටයුතු කර ඇත. එමගින් කොමිෂන් සභාවේ කටයුතුවල කාර්යසාධනය ඵලදායී මෙන්ම පෙරට වඩා වේගවත් වී ඇත. ආයතනින අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කරගැනීම මූලික කරගත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් කාර්ය සාධනය ඉහළ නැංවීම කටයුතු කර ඇත.

# 07 පරිච්ඡේදය
# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දින ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාල නැත. | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | අදාල නැත. | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාල නැත. | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | අදාල නැත. | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. රා.පරි. අමාත්‍යාංශය විසින් මෙතෙක් පත්වීම සිදුකර නැත. |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යා වක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත. | කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත. | කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇති අතර රා.ප.අමා. වෙත දැනුම් දී ඇත. |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ,, | ,, |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | ,, | ,, |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන ප්‍රකාරව,<br>සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | ,, | ,, |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල නොවේ | ,, | අභ්‍යන්තර විගණන කමිටු 01 ක් පවත්වා ඇත. |
| **8** | **වත්කම් කළමනාකරණ** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.2 | නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූලවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල නොවේ | කොමිෂන් සභාවේ කාර්ය භාරය වෙනස්වීම හා අනුමත කාර්ය මණ්ඩලය හිඟකම නිසා කටයුතු ප්‍රමාද වී ඇත. | ඉදිරියේදී ගර්හිත භාණ්ඩ අපහරණය කිරීමට අපේක්ෂිතය. |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | එක් ගර්හිත වාහනයක් ඇත. | අපහරණය කිරීමේ අභ්‍යන්තර කාර්ය පටිපාටිය සිදුකරමින් පවතී. |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන වාහන අනතුරක් සම්බන්ධයෙන්ම 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම. | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව පර්යේෂණය කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 37 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | ආදායම් මුදල් රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |
| **18** | **පුරවැසි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

අවසානය

ඇමුණුම 01

# ජාතික පොලිස් කොමිෂන් සභාවේ
# පළාත් කාර්යාල

| | |
|---|---|
| **බස්නාහිර පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)<br>ගොඩනැගිලි අංක 09, **BMICH**,<br>කොළඹ 07.<br><br>**:** 0112166504, 0112166521**/2**<br>ෆැක්ස් : 0112166577<br>ඊමේල්: **info@npc.gov.lk**<br>වෙබ් අඩවිය : **www.npc.gov.lk**<br>**: 0710361010** | **උතුරු පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (උතුරු පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>යාපනය.<br><br>0112166535 |
| **සබරගමුව පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (සබරගමුව පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>නව නගරය, රත්නපුර.<br><br>**:** 0112166538 | **උතුරු මැද පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (උතුරු මැද පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>අනුරාධපුරය.<br><br>**:** 0112166531 |
| **ඌව පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (ඌව පළාත)<br>අංක 05, පීලිපොතගම පාර,<br>බදුල්ල.<br><br>: 0112166532 | **දකුණු පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (දකුණු පළාත)<br>පළමු මහල,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>ගාල්ල.<br><br>: 0112166534 |
| **වයඹ පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (වයඹ පළාත)<br>3 වන මහල, අංක. 08 කාමරය,<br>පේෂකර්ම වෙළඳ සංකීර්ණය,<br>අංක 04, මිහිඳු මාවත,<br>කුරුණෑගල.<br><br>: 0112166536 | **මධ්‍යම පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>මහනුවර.<br><br>: 0112166537 |
| **නැගෙනහිර පළාත**<br><br>පළාත් අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත)<br>ග්‍රීන් වීදිය,<br>මඩකලපුව.<br><br>: 0112166533 | |